ආර්ථික සංවර්ධනය යනු, රටක නිමවුමේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනය වීමයි. න්‍යායාත්මක වශයෙන් ගත්කළ සාක්ෂරතා අනුපාතය, ආයු අපේක්ෂාව, දරිද්‍රතා අනුපාතය වැනි විවිධ වූ දර්ෂකයන් ඇසුරින් රටක ආර්ථික සංවර්ධනය නිර්වචනය කල හැකිය.ආර්ථික සංවර්ධනය අධ්‍යයනය කරන ලෝක බැංකුව ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳ ඇගයුම ශ්‍රී ලංකාව තීරණාත්මක සංධිස්ථානයක පසුවන බව සඳහන් කරයි.තිස් වසරක යුද්ධය, පාස්කු ප්‍රහාරය හා වර්තමානය වන විට පවතින කොවිඩ් - 19 වසංගතය හමුවේ දශක 09 කට පසු මුහුණ දීමට සිදු වූ බිඳ වැටුණු ආර්ථිකයේත් සියලුම අංශයන් නැවත ඉහළ මට්ටමකට ඔසවා ගැනීමට රජය දක්වන දායකත්වය සම්බන්ධයෙන් ගැටලුවක් ගොඩනැගී ඇත.මෙම පර්යේෂණය ද්විතියික දත්ත මත පදනම් වූ විස්තරාත්මක පර්යේෂණයකි.මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනයට රජය විසින් ලබා දිය යුතු දායකත්වය පිළිබඳ විග්‍රහයක් කිරීමයි.මෙම සමීක්ෂණයට අනුව රජය විසින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අභිමතාර්ථ මත පදනම් වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නාගරික වෙළෙඳපොළ හා ක්‍රියාකාරී නීති පද්ධතියක් රජය විසින් ඇති කිරීම, බදු සහන හා ඉන්ධන ලබා දීම, අවදානම් කලමනාකරණය හා නව ආර්ථික අවස්ථා උත්පාදනය, පෞද්ගලික ආයෝජන හා අපනයන මුල් කරගත් ආර්ථිකයන් ඇති කිරීම ආදී කරුණු රටක් වශයෙන් ආර්ථික සංවර්ධනයක් කරා ගෙන යාමට සුදුසු වන බව හඳුනාගැනීමට හැකිය.ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් ආර්ථිකමය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කරවීමට කටයුතු කරන රජයේ නිලධාරීන්ට මෙම කරුණු අනුව සංවර්ධනය ප්‍රතිපත්ති ගොඩනැංවිය හැකි වනු ඇත.

**මුඛ්‍ය පදඃ** *ආර්ථික සංවර්ධනය, සංවර්ධන වැඩසටහන්, රජයේ නිලධාරීන්*

[1] diltharushika96@gmail.com, ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# 1977 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ විශ්ලේෂණයක්

*කේ. ඩී. එම්. එන්. කුමාරි* [1]

**සංක්ෂේපය**

ආර්ථික ප්‍රතිපත්තියක් තුළින් අවධානය යොමු කෙරෙන්නේ රටක ආර්ථික ක්‍රියාවලියේ දිශානතිය, අරමුණු සහ ක්‍රියාවලිය පෙන්නුම් කරනු ලබන සුවිශේෂී ලේඛනයක් ලෙස ද හැඳින්විය හැකි ය. විශේෂයෙන් ආර්ථිකමය, ගෝලීය සංවර්ධන බලපෑම්, සම්පත් හිඟකම, ප්‍රාග්ධනය, තාක්ෂණය, වෙළඳපොළ ප්‍රසාරණය වීම වැනි ප්‍රශ්න විසදාලීමේ සාර්ව ආර්ථික ප්‍රතිපත්තියක් පිළිබඳ ව දශක ගණනාවක් පුරාවට ම අවධානය යොමු කරන ලදී. ඒ අනුව 1948 වර්ෂයේ සිට 2014 දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිපත්තින් තුළ ම මෙරට සංවර්ධන ප්‍රතිපත්තිය සුවිශේෂී මඟකට යොමු කිරීමට හේතු පාදක විය. එම ප්‍රතිපත්ති තුළ 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නැත්නම්, බාහිරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්තිය විදේශිය පෞද්ගලික අංශය දේශිය ආර්ථිකයට යොමු කරමින් ලෝක ආර්ථික ක්‍රමවේදය වෙත දිශානතිගත කිරීමක් සිදු කරන ලදී. එබැවින් මෙම පර්යේෂණයේ මුඛ්‍ය අභිමතාර්ථය බවට පත් වන්නේ 1977 වර්ෂයෙන් පසු විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි සිදු කරන ලද බලපෑම පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමයි. එහිදි අවධානය යොමු කරනු ලබන්නේ, 1977 සිට 88 දක්වා යුගය, 1989 සිට 1994 දක්වා යුගය, 1994-2004 දක්වා යුගය සහ 2004 සිට 2016 දක්වා ක්‍රියාත්මක වු මහින්ද චින්තන යුගයයි. විශේෂයෙන් මෙම ආර්ථික ප්‍රතිපත්තිය සඳහා පාදක වු හේතුන්, ක්‍රමෝපායන් සහ ආර්ථික දර්ශනය කෙරෙහි වඩාත් අවධානය යොමු කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ. මෙම පර්යේෂණයේ ගැටලුව බවට පත් වන්නේ අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට මෙකී සංවර්ධන ප්‍රතිපත්තිය කෙතරම් දුරට සාධනීය මෙන් ම නිශේෂධනීය ආකාරයෙන් බලපෑමක් සිදු කර ඇත්තේ ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කිරීමයි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස විස්තරාත්මක සහ විශ්ලේෂණාත්මක ක්‍රමවේදයත්, අධ්‍යයනය සඳහා ද්විතියික දත්ත භාවිතයට ගෙන ඇත. පර්යේෂණ නිගමනය බවට පත් වන්නේ මෙම විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හරහා සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකමය වශයෙන් මුහුණ දෙන අභියෝග, ප්‍රශ්න විසඳාලීමත්, ඒ තුළින් ඉලක්ක ඉදිරියට මෙහෙයවා සංවර්ධනය ඉදිරියට වේගවත් කර ගැනීමේ අවස්ථාව මේ තුළින් නිර්මාණය වී ඇති බවයි. එබැවින් විවිධ මුහුණුවරකින් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ඇති යෝජනා වශයෙන්, ආර්ථික සංවර්ධනය තුළ පෞද්ගලික අංශයේ මැදිහත් වීම පුළුල් කිරිම, ජාතික මෙන් ම ජාත්‍යන්තර තාක්ෂණික සබඳතා පුළුල් කර ගැනීම, වෙළඳපොල ප්‍රසාරණ අවස්ථා පුළුල් කිරීම, රට තුළ භෞතික සම්පත් භාවිතයට ගැනීම මෙන් ම රට තුළ දේශපාලන ක්‍රමවේදයත්, රාජ්‍ය ප්‍රතිපත්තීන්හි ස්ථාවරත්වයත් ගොඩ නැංවීම, යනාදී කාරණා අත්‍යාවශ්‍ය වේ.

**මුඛ්‍ය පද;** *ශ්‍රී ලංකාව, විවෘත ආර්ථික ප්‍රතිපත්තිය, ආර්ථික සංවර්ධනය*

[1] nisansaladissanayaka95@gmail.com, දේශපාලන විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ තේ වගාව සහ ග්‍රාමීය දරිද්‍රතාවය (රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරින්)

*එස්. එච්. එම්. පී. පියරත්න* [1]

**සංක්ෂේපය**

තේ ගස ප්‍රථමයෙන්ම සොයාගනු ලැබ ඇත්තේ චීනයේ රජකම් කළ සෙන්නූන් අධිරාජ්‍යයා ය. මෙසේ සොයා ගනු ලැබූ තේ ගස 1867 දී පමණ ශ්‍රී ලංකාව තුළ වාණිජමය වැවිලි බෝගයක් ලෙස ව්‍යාප්ත විය. වර්තමානය වනවිට තේ ප්‍රධාන අපනයන බෝගයක් මෙන්ම අපේ රටට විනිමය සපයන ප්‍රධාන අපනයන මාර්ගයක් වශයෙන් ද හඳුන්වා දිය හැකිය. මේ සඳහා කුඩා පරිමාණ තේ වගාව තුළින් විශාල දායකත්වයක් සපයනු ලබයි. 2018 වර්ෂය වන විට වතු අංශය සඳහා කුඩා පරිමාණ තේ වගාවේ දායකත්වය සියයට 75ක් පමණ වේ. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල කුඩා පරිමාණ තේ වගාව විශාල පරිමාණයෙන් සිදුවන බවත් ඒ සඳහා විශාල වගාකරුවන් ප්‍රමාණයක් ශ්‍රම දායකත්වය සපයන බවත් සඳහන් කළ යුතුය. නමුත් එම වගා භූමි තුළින් ඉහළ  ගුණාත්මක ඵලදාවක් ලබාගැනීම අසීරු වී ඇත. වගාව සඳහා මූලික අවශ්‍යතා හිඟ වීමෙන් මෙවැනි තත්ත්වයක් උදා වී ඇති බව වාර්තාවලින් හෙළි වී ඇත. රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය ප්‍රදේශයක් මුල් කරගෙන කරන ලද මෙම අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ තේ වගාව මඟින් ග්‍රාමීය දරිද්‍රතාව තුරන් කිරීමට හැකියාවක් පවතිනවා ද යන්න සොයා බැලීම මෙහි මූලික ගැටලුව වේ. එහිදී  ද්විතික දත්ත පදනම් කරගෙන ප්‍රදේශය පිළිබඳ මූලික අධ්‍යයනයක නිරත වී ඇත. මීට අමතරව ප්‍රාථමික දත්ත පදනම් කරගෙන විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රමය යටතේ පාදක කරගත් අරමුණු වන ග්‍රාමීය දරිද්‍රතාවක් ඇතිවී ඇත්තේ කුමන හේතු නිසාවෙන් ද ග්‍රාමීය දරිද්‍රතාව සඳහා කුඩා පරිමාණ තේ වගාවෙන් බලපෑමක් ඇති වනවාද එහිදී වගාකරුවන් විසින් යම්කිසි විසඳුමක් යටතේ දරිද්‍රතාවෙන් මිදීමට කටයුතු කරනවාද යන්නත්  පිළිබඳව සොයා බැලීමක් සිදු කෙරිණි. මෙම අධ්‍යයනයට අනුව වගාකරුවන් අපේක්ෂා කරනු ලබන්නේ සහනාධාර යටතේ නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාමාර්ග සකස් කිරීමට අවශ්‍ය බවය. නිශ්චිත ක්‍රියාමාර්ග සඳහා යොමුවීමෙන් අපේක්ෂිත අමු තේ ඵලදායිතාව සහ එහි ගුණාත්මකභාවය ඉහළ නංවා ගැනීමට හැකියාවක් පවතින බවට ද අපේක්ෂා කළ හැකි බව වගාකරුවන් තුළින් ඉස්මතු වූ කරුණකි. අධ්‍යයනයට අදාළව නිගමනය කළ හැකි වන්නේ කුඩා පරිමාණ තේ වගාව ආශ්‍රිත වගාකරුවන් සැබෑ වශයෙන් ග්‍රාමීය දරිද්‍රතාවයකට මුහුණ දෙන බවයි.

**මුඛ්‍ය පදඃ** *තේ වගාව, කුඩා පරිමාණ තේ වගාව, කුඩා පරිමාණ තේ වගාකරුවන්, ග්‍රාමීය දරිද්‍රතාවය*

[1] manjulaprabodani95@gmail.com, ආර්ථිකවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# කුඩා ව්‍යාපාර සඳහා මූල්‍ය සම්පාදනය

*ඩබ්. පී. එස්. ශ්‍රීමාලි* [1]

## සංක්ෂේපය

කුඩා ව්‍යාපාර ආර්ථිකයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකරගෙන ඇති අතර අපනයන ප්‍රවර්ධනය, ඒක පුද්ගල ආදායම ඉහළ නැංවීම , දේශීය ආර්ථික වෘද්ධිය ඉහළ නැංවීම සහ රැකියා උත්පාදනය සඳහා සුවිසාල දායකත්වයක් ලබා දෙයි. ගෝලීයකරණය හා පෞද්ගලීකරණය සමඟ ලොව සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද කුඩා ව්‍යාපාර වර්ධනය උදෙසා විශේෂ අවධානයක් යොමු කර ඇත. ආර්ථිකයේ දැඩි තරඟකාරීත්වය මත කුඩා ව්‍යාපාර දුෂ්කරතාවයන් රැසකට මුහුණ දෙන අතර ප්‍රාග්ධන හිගකම, ශ්‍රම හිගකම, ව්‍යාපාරික සැලසුම් ක්‍රියාත්මක කිරීමෙදී තාක්ෂණික පහසුකම් අවම වීම ඒ අතර ප්‍රධාන වේ. මේ අතුරින් ව්‍යාපාරයේ පැවැත්ම සඳහා ඍජුවම බලපාන අභියෝගයක් ලෙස ප්‍රාග්ධන සම්පාදනයේදී ඇතිවන ගැටලු දැක්විය හැකිය. කුඩා ව්‍යාපාර ප්‍රාග්ධන අවශ්‍යතාවලදී අභ්‍යන්තර හා බාහිර වශයෙන් විවිධ මූල්‍ය සම්පාදන ක්‍රම අනුගමනය කරන අතර බාහිර ප්‍රාග්ධන මූලාශ්‍ර භාවිතයේදී වැඩි වශයෙන් අවිධිමත් ණය ක්‍රමවේද වෙත යොමු වීමේ තත්ත්වයක් පවතී. කුඩා ව්‍යාපාර සංවර්ධනය සඳහා වාණිජ බැංකු හරහා ණය වැඩසටහන් ක්‍රියාත්මක වුවද මූල්‍ය සම්පාදන කටයුතුවලදී වාණිජ බැංකු කෙරෙහි කුඩා ව්‍යාවසායකයින් යොමු නොවීම සඳහා කුමන ආකාරයේ සාධකයන්හි බලපෑමක් පවතී ද යන්න අධ්‍යයනය මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඩා ව්‍යාපාර පනහක් සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ නියදිය ලෙස තෝරා ගන්නා ලදී. පර්යේෂණ සීමා ලෙස සේවා සපයන කුඩා ව්‍යාපාර පමණක් සහ විධිමත් මූල්‍ය සම්පාදන ක්‍රම වේද යටතේ වාණිජ බැංකු ණය පිළිබඳ පමණක් අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. ප්‍රාථමික දත්ත සහ ද්විතියික දත්ත යොදා ගත් අතර ප්‍රශ්නාවලියක් මඟින් ප්‍රාථමික දත්ත රැස් කරගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිත කර අතර විශ්ලේෂණාත්මක මෙවලම් ලෙස SPSS හා Excel මෘදුකාංග යොදා ගැනිණි. බැංකු ණය සඳහා ඉහළ පොළියක් ගෙවීමට සිදුවීම, දැඩි ඇපකර කොන්දේසි මත අවශ්‍ය ඇපසුරැකුම් ඉදිරිපත් කිරීමේ අපහසුතාවය, බැංකු ණය වැඩසටහන් පිළිබඳ දැනුවත්භාවය අඩු බව, බැංකු ණය ලබා ගැනීමේ දී හුවමාරු පිරිවැය ඉහළ යාම , රජය මඟින් වාණිජ බැංකු හරහා ව්‍යාපාර ණය ලබා දීමේදී දේශපාලන මැදිහත්වීම් සිදු වීම යන සාධක හේතුවෙන් කුඩා ව්‍යවසායකයින් මූල්‍ය අවශ්‍යතාවලදී වාණිජ බැංකු ණය සඳහා යොමු නොවන බවත් බැංකු ණය ලබා ගැනීම සම්බන්ධව කුඩා ව්‍යවසායකයින්ට ප්‍රමාණවත් ඉඩ ප්‍රස්ථා පුළුල් නොවීම මත ඔවුන් අවිධිමත් ණය මූලාශ්‍ර වෙත යොමු වීම සිදුවන බවත් නිගමනය කළ හැකිය. බැංකු විසින් කුඩා ව්‍යවසායකයින්ට ණය ලබා දීමේදී අනුගමනය කරනු ලබන සංකීර්ණ රෙගුලාසිවල නම්‍යශීලී බව වැඩි කිරීම තුළින් විධිමත් මූල්‍ය ප්‍රවේශයක් ලබා ගැනීමට ඇති හැකියාව පුළුල් වන අතර රාජ්‍ය මැදිහත්වීම මත ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම, ඇප ආවරණ යෝජනා ක්‍රම විධිමත් සහ සර්ව සාධාරණව ක්‍රියාත්මක කිරීම මඟින් කුඩා ව්‍යවසායකයින් මුහුණ දෙනු ලබන ප්‍රාග්ධන අර්බුදය විසඳා ගැනීමෙහිලා සුවිසාල දායකත්වයක් ලැබෙනු ඇත.

***මුඛ්‍ය පද :*** *කුඩා ව්‍යාපාර , මූල්‍ය සම්පාදනය , වාණිජ බැංකු ණය*

---

[1] sachinishrimali@gmail.com, ආර්ථිකවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකා ජනගහයේ මෑත කාලීන උපනතීන්

*කේ. එම්. ඩී. එම්. තිලකරත්න* [1]

**සංක්ෂේපය**

රටක උපත් හා මරණ අනුපාතිකයන් අතර පවත්නා වෙනසෙහි ප්‍රතිඵලයක් ලෙස ස්වභාවික වර්ධනයක් සිදු වීම හෝ නොවීම සිදු වන අතර එය ජන සංඛ්‍යා ව්‍යුහය පිළිබඳ අධ්‍යයනයේ එක් පැතිකඩක් වේ. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවෙහි ජනගහන වර්ධනය වර්තමානය වනවිට සංඛ්‍යාත්මක වශයෙන් ක්‍රමිකව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ ද ජනගහනයේ වර්ධන වේගය පහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලින උපනතීන් පිළිබඳ 1871 දී පැවැත් වූ ප්‍රථම ජන සංගණනය වැදගත් වන අතර එය හේතුකොට ගෙන එම කාල වකවානුවේ පැවැති ගති ලක්ෂණයන් සහ එම ලක්ෂණයන් වර්තමානය වන විට එනම් 2012 අවසාන ජන සංගණනය වන විට කොතෙක් දුරට වෙනස් වී ඇත් ද යන්න සහ 2012 ජන සංගණනය පාදක කර ගනිමින් ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහනයේ හඳුනාගත හැකි උපනතීන් මොනවාද යන්න මෙම ලිපිය මගින් මුලිකව ම සාකච්ඡාවට ලක් කර ඇත. මෙම මෑත කාලින උපනතින් ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන ගමනට එල්ල කරන බලපෑමත් මෙහිදී සැකවින් සාකච්ඡාවට ලක්කොට ඇත. මෙම අධ්‍යයනය සඳහා ද්විතීයික දත්ත යොදා ගන්නා ලදී. සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රම ශිල්ප යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලද අතර ප්‍රස්තාර හා වගු භාවිතයෙන් දත්ත ඉදිරිපත් කර ඇත. මෙම අධ්‍යයනයේ දී ස්ත්‍රී සාඵල්‍යා අනුපාතිකය පහළ අගයක් ගැනීම, පුරුෂ ජනගහනයට සාපේක්ෂව ස්ත්‍රී ජනගහනය ඉහළ යෑම, රැකියා සහ අධ්‍යාපන කටයුතු සඳහා බාහිර සංක්‍රමණ වැඩි වීම, ළමා ජන සංඛ්‍යාව අඩු වීම, වියපත් ජනගහනයේ වැඩි වීම, ආදී ප්‍රධාන උපනතීන් කිහිපයක් හඳුනාගත හැකි විය.

**මුඛ්‍ය පද :** ජනගහනය, ජනගහනයේ වර්ධනය, ප්‍රවණතා, උපනතීන්

---

[1] dineshmadusankat@gmail.com, සමාජීයවිද්‍යා පීඨ පර්යේෂණ මධ්‍යස්ථානය, කැලණිය විශ්වවිද්‍යාලය

# *MASS COMMUNICATION AND INFORMATION TECHNOLOGY*

# Mass Media and cultural imperialism in Sri Lanka (A special reference on the impact of Korean Tele drama's soft power to Sri Lankan culture)

*W.M.Piyumali* [1]

**Abstract**

This Research paper examines the impact of Korean Tele dramas that broadcasting in Sri Lankan channels to the subjugation of Sri Lankan culture and the emergence of Koreans culture. The selected dramas are famous and adored in both Korean & Sri Lankan audience. They contain insight in to the Korean culture, religion, myths, Korean music, the Korean pop culture and also the background of the Korean society. This research employs the method of both qualitative and quantitative analysis (mixed research method). To prepare research findings the data gathering tools used were interviews and questionnaires. The sample size of 100 was involved in the study through questionnaire data gathering technique by using random sampling methods, how simple television productions can be used as a tool for effective social changes & win millions of hearts and minds in the nation was researched. The cultural Influences made by these dramas created market potential for such culture based commercial goods in the local market. The hidden truth behind it is that they used the ideology of these dramas for establish themselves in the local market as well as to publicise their businesses. The lifestyles of many Sri Lankan have been affected by these Korean characters and ideologies they stand for. This is controversial social, cultural and media industrial challenge for Sri Lanka due to the gradual invasion of the culture by the Korean soft power thus creating an ideology to trap on the local audience as well as on the very core of the local culture.

**Keywords:** *Media, Globalization, Cultural imperialism, Korean dramas, Ideology*

[1] maheshapiyumali97@gmail.com, Department of Mass Communication, University of Kelaniya

# Use of Social Media to Release Personal Stress

*W. A. D. Madhusriya* [1]

**Abstract**

This research discusses the Use of Social Media to Release Personal Stress. Social media consist of computer-mediated technologies that facilitate the creation and sharing of information, ideas, career interests, and other forms of expression via virtual communities and networks. Many people today tend to release their stresses through social media. Hence this research is very timely. The research in consideration looks into the problem of 'What is the use of social media in releasing personal stress?' Accordingly, the research questions are as follows 1) do people release their stress through social networks? 2) how do people release their stress through social networks? And lastly, 3) what are the most commonly used social media platforms to release stress? The main purpose of this study is to identify 'Why people are tempted to use social media to release personal stresses? The objectives are to identify the factors that affect personal stress? Does using social media to relieve stress reduce their stress? How does the use of social media to relieve stress affect society? In this study, it is hypothesized that social networks build/ strengthened through social media platforms as a mode to relieve personal stresses. The study also followed a quantitative methodology when conducting the research and collected qualitative data through surveys using the Random sampling method. Primary data was collected through a Google form questionnaire by sharing it on social media. For this, 100 responders in to 21-30 age limit were used as the sample. The study has analyzed data by SPSS. According to the data obtained, in the age group of 21-30, 84.56% of database users say that social media is used to relieve stress, and 96% of that percentage reported that stress is released without harming others and society. 92% of people say that Facebook, WhatsApp, and Instagram are the most used social media platforms utilized to relieve stress. The majority of the sample uploads statuses, posts, shares posts, and writes poetry as a way to relieve stress. 68% of the responders stated that engaging in such activities can reduce stress. It is noteworthy to identify that 97% of people use emoji to relieve their stress. Finally, this research concludes that there is a positive effect in terms of relieving a person's stress through social media.

**Key words:** *Stress, Social media, Mental Health, Facebook, Social factors*

[1] dinushad50@gmail.com, Department of Sociology, University of Kelaniya

# තොරතුරු ගවේෂණය සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල තුළ භාවිත කරනු ලබන තොරතුරු ගවේෂණ උපක්‍රම පිළිබඳ විද්‍යාර්ථීන්ගේ දැනුවත්භාවය පිළිබඳ අධ්‍යනයක් (කැළණිය විශ්වවිද්‍යාල පුස්තකාලය ඇසුරින්)

*ඩබ්ලිව්. ආර්. එන්. ඉන්ද්‍රචාපා [1]*

**සංක්ෂේපය**

තාක්ෂණයේ දියුණුවත් සමග වර්තමානය වනවිට තොරතුරු බිහිවීමේ සීඝ්‍රතාවය වර්ධනය වී ඇත . මේ හේතුවෙන් විවිධ විෂය ක්ෂේත්‍රයකට අදාළව විවිධාකාර තොරතුරු බිහිවන අතර තොරතුරු බහුලතායක් ඇති වී තොරතුරු පුපුරායාමකට ලක් වේ . මෙලෙස තොරතුරු බහුලතාවය නිසාවෙන් තමාට අවශ්‍ය නිවැරදි තොරතුරු නිවැරදි ආකාරයෙන් ලබා ගැනීමට බොහෝ දෙනා උත්සහ කරනු ලබයි. . ඒ අතරින් විශේෂිත කණ්ඩායමක් ලෙස විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් දැක්විය හැකිය . එම නිසා වර්තමානයේ විශ්වවිද්‍යාල පුස්තකාලයන් තුළ විද්‍යාර්ථීන්ට නිවැරදි තොරතුරු ගවේෂණය සඳහා විවිධ ගවේෂණ උපක්‍රම හඳුන්වා දී ඇත . මෙම තොරතුරු ගවේෂණ උපක්‍රම හරහා තොරතුරු අවශ්‍ය වේලාවට , නිවැරදි ආකාරයෙන් ලබා ගැනීමට හැකියාව ලැබේ . මෙලෙස විවිධාකාර වූ ගවේෂණ ක්‍රමවේදයන් විශ්වවිද්‍යාල පුස්තකාලයන් තුළ පැවතියද ඒ පිළිබද විද්‍යාර්ථීන් තුළ පවතින දැනුවත්භාවය මදගතියක් පැවතීම මෙම පර්යේෂණයට පාදක වූ ගැටලුවයි . මෙම අධ්‍යනයේ මූලික අරමුණු වන්නේ , විශ්වවිද්‍යාල පුස්තකාලයන් තුළ තොරතුරු ගවේෂණයට භාවිතා කරනු ලබන ගවේෂණ උපක්‍රම හදුනාගැනීම , ගවේෂණ ක්‍රම භාවිතයෙන් විද්‍යාර්ථීන්ට තොරතුරු දැනගැනීමට ඇති හැකියාව අධ්‍යනය කිරීම හා ගවේෂණ ක්‍රමවේදයන් පිළිබඳ ඔවුන්ගේ පවතින දැනුවත්භාවය හදුනා ගැනීමයි . මෙහිදී දත්ත රැස් කිරීම සඳහා ප්‍රථමික හා ද්විතීයික මූලාශ්‍ර භාවිතා කළ අතර ප්‍රථමික මූලාශ්‍රයන් ලෙස නිරීක්ෂණය හා ප්‍රශ්නාවලීන් ද ද්විතීයික මූලාශ්‍රයන් ලෙස පොත්පත් හා වාරසඟරාද භාවිතා කරන්නට විය . මෙම අධ්‍යනය සිදුකරනු ලැබූයේ සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය යටතේ ප්‍රමාණාත්මක පරේය්ෂණ ක්‍රමවේදය මිශ්‍රිතව භාවිතා කර ගනිමිනි. එමෙන්ම සංගහණය වශයෙන් කැළණිය විශ්වවිද්‍යාල පුස්තකාලය භාවිතා කරනු ලබන සියලුම විද්‍යොර්ථීන් තෝරාගනු ලැබූ අතර නියැදිය තේරීමේදී අහඹු නියැදීමේ ක්‍රමට යටතේ විද්‍යාර්ථියින් 200 දෙනෙකු තෝරාගනු ලැබීය . මෙහිදී දත්ත විශ්ලේෂණය සඳහා EXCEL මෘදුකාංගය භාවිතා කරනු ලැබීය . මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් පුස්තකාලයන් තුළ විවිධාකාර තොරතුරු ගවේෂණ උපක්‍රම භාවිතා කළද එකිනෙක විද්‍යාර්ථීන් තුළ ඒ පිළිබද පවතින දැනුවත්භාවය දුර්වල මට්ටමක පවතින බව හා පුස්තකාලය තුළ භාවිත කරනු ලබන ගවේෂණ ක්‍රමවේදයන් ප්‍රමාණවත් නොවන බව අනාවරණ කරගත හැකි විය.

**මුඛ්‍ය පදඃ** *තොරතුරු තාක්ෂණය , තොරතුරු ගවේෂණය , ගවේෂණ ශිල්ප ක්‍රම , සෙවුම් වර්ග , විශ්වවිද්‍යාලය*

[1] nayanachapa15@gmail.com, නාවික හා ඉංජිනේරු විශ්වවිද්‍යාලය

# සමාජ මාධ්‍ය පුද්ගල සම්බන්ධතාව කෙරෙහි ඇතිකරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

සී. එම්. රමිත් ප්‍රේෂාල් චන්ද්‍රසේකර [1]

**සංක්ෂේපය**

මානවයා තම අදහස් එකිනෙකා අතර හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය සන්නිවේදනය ලෙස සරලව ඉදිරිපත් කළ හැකිය. තාක්ෂණික දියුණුවත් සමඟ වර්තමානයේ සන්නිවේදනය ඉතාමත් සරල ක්‍රියාවක් බවට පත්ව ඇත. වර්තමාන තාක්ෂණයේ ඇතිව ඇති දියුණුවත් සමඟ පුද්ගල සබඳතා බිඳ වැටීමේ ප්‍රවණතාවයක් ගොඩ නැගී ඇත. වත්මන් පුද්ගල මනෝභාවයන්ට අනුව ඒකාකාරී ජීවන රටාවේ සමාජය තුළ යම් හුදකලා බවකට වත්මන් මිනිසා මුහුණ දෙමින් සිටී. මෙහි දී ඇතිවන රික්තකයට විසඳුම් සෙවීමේ දී සමස්ත සමාජය තුළ සමාජ මාධ්‍ය භාවිතය ප්‍රමුඛ වී ඇත. අතීතයේ රූපවාහිනී, ගුවන්විදුලි මාධ්‍යයන් වටා පවුල යන ඒකකය විසිරී පැවතිය ද වර්තමාන සමාජ මාධ්‍ය ඔස්සේ සන්නිවේදන ක්‍රියාවලිය තුළ පුද්ගල කේන්ද්‍රීය වපසරියක් තුළ නිර්මාණය වී තිබේ. එම නිසා විෂම සමාජ පුද්ගල අවශ්‍යතාවන්ගේ ස්වරූපය ද විවිධ දිශානතීන් ඔස්සේ ව්‍යාප්ත වී ඇත. වර්තමාන සමාජය සමාජ මාධ්‍යවලට ඇබ්බැහි වීම මගින් අනුකරණය හා පෙළඹීම හේතුවෙන් එකිනෙකා අතර සහ සම්බන්ධතාව අවම වීම සමාජයේ බහුලව දක්නට ලැබේ. සමාජ මාධ්‍ය පුද්ගල සම්බන්ධතාව කෙරෙහි බලපෑමක් ඇති කරන්නේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ලෙසට ද්විතීක මූලාශ්‍ර යොදා ගන්නා ලදී. එහි දී පුවත්පත්, සඟරා, අන්තර්ජාල ලිපි උපයෝගී කරගනිමින් දත්ත රැස් කර ගන්නා ලදී. තව ද මනෝවිද්‍යා උපදේශකයන් හා සමාජ විශ්ලේෂකයන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මගින් ද මෙම පර්යේෂණයට අවශ්‍ය වන තොරතුරු රැස් කර ගන්නා ලදී. එසේ රැස් කළ දත්ත විශ්ලේෂණයේ දී නිගමනය කළ හැකි කරුණු වූයේ වර්තමානයේ තාක්ෂණික දියුණුවත් සමඟ මාධ්‍ය ජාලා මගින් පුද්ගල සම්බන්ධතාවයන්ට වයස් සීමාවකින් තොරව ඍජු හා වක්‍ර බලපෑම් රාශියක් එල්ල කරමින් සමාජයේ සයිබර් මානසිකත්වයක් ගොඩ නගමින් සිටින බවයි. මෙම සමාජ මාධ්‍ය හේතුවෙන් වත්මන් සමාජයේ පවුල් සංස්ථාව තුළ ආරවුල් ඇතිවීම්, විවාහ දෙදරා යාම් හා අනියම් සබඳතා ගොඩනැගීම්, විවිධ අපචාර සිදුවීම් ආදිය දක්නට ලැබේ. වර්තමාන සමාජ, සංස්කෘතියේ පුද්ගලයින් අතර සබඳතා ගොඩනඟා ගැනීමට නොහැකි වී ඇත්තේ සමාජ මාධ්‍යයන්ගේ ඇති අසීමිත අහිතකර බලපෑම් හේතුවෙනි යන්න මෙම අධ්‍යයනයේ දී නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද:** *අන්තර්ජාලය, පුද්ගල සම්බන්ධතා, පෙළඹීම, බලපෑම, සමාජ මාධ්‍ය*

[1] ramithpreshal04@gmail.com, කැලණිය විශ්වවිද්‍යාලය

# 2019 ජනාධිපතිවරණය සහ මාධ්‍ය හැසිරීම (ලංකාදීප පුවත්පතට විශේෂිතව සිදු කරන ලද අධ්‍යයනයක්)

*සී. බී. වනිගසිංහ [1], ඒ. එම්. එස්. කේ. අත්තනායක [2]*

**සංක්ෂේපය**

ජනාධිපතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීමට පැය නවයක කාලයකට සීමා වුව ද කුමන පක්ෂයක කුමන අපේක්ෂකයාට ඡන්දය භාවිත කළ යුතු ද යන මතය නිර්මාණය කිරීමට බොහෝ කාලයක් ගත වනු ඇත. එකී මතය නිර්මාණය කිරීමේ මෙහෙවර ජනමාධ්‍ය මෙන්ම අද්‍යයතනයේ දී නව මාධ්‍යයන් ද විසින් සිදු කරනු ඇත. මෙම අධ්‍යයනයේ දී 2019 ජනාධිපතිවරණය කාල සීමාව තුළ දී පුවත්පත් මාධ්‍ය තුළ වාර්තාරකණය සිදු කළ ආකාරය දිනපතා ලංකාදීප පුවත්පතට විශේෂිතව අධ්‍යයනය කෙරේ. 2019 ජනාධිපතිවරණයේ දී ලංකාදීප පුවත්පතෙහි මාධ්‍ය හැසිරීම කෙබඳු ද? යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ මූලික ගැටලුව විය. 2019 ජනාධිපතිවරණයේදී ලංකාදීප පුවත්පතෙහි මාධ්‍ය හැසිරීම පිළිබඳ  අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම පර්යේෂණය සඳහා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය යොදා ගන්නා ලදී. ජනාධිපතිවරණය සඳහා නාමයෝජනා ඉදිරිපත් වූ 2019 ඔක්තෝම්බර් මස 07 වන දිනයේ සිට ජනාධිපතිවරණය පැවැත් වූ 2019 නොවැම්බර් මස 16 දින දක්වා මුද්‍රිත, දිනපතා  ලංකාදීප පුවත්පත්වල පළ වූ පුවත්, විශේෂ පිටු සහ අතිරේක,  විශේෂාංග ලිපි, කතුවැකි හා කාටූන් පිළිබඳ අන්තර්ගත විශ්ලේෂණය සිදු කරන ලදී. පුවත්පතේ මුල් පිටුව තුළ පළ වූ පුවත් හා සිරස්තල තුළ ගෝඨාභය රාජපක්ෂ මහතාට වැඩි අවස්ථාවක් ලබා දී ඇති බව නිගමනය විය. ප්‍රධාන ශීර්ෂපාඨය මගින් කිසිදු අපේක්ෂකයෙකුට සෘජුවම සහය පළ කරන ආකාරයේ වාර්තාකරණයක් සිදු කොට නොතිබුණ ආකාරයත් යම් අවස්ථාවන්වලදී ගෝඨාභය රාජපක්ෂ මහතාට වක්‍රාකාරයෙන් සහය පළවන ආකාරයේ පුවත් වාර්තා කරණයක් සිදු කොට ඇත. පුවත්පතේ හැඩය  යම් යම් අවස්ථාවන් තුළ වෙනස් වී ඇති අතර මුල් පිටුවට පෙර විශේෂ පිටුවක් එකතු කොට ඇති බව නිගමනය විය. මැතිවරණ කාලසීමාවක් තුළ දී රටේ ජනමාධ්‍ය හැසිරීම කෙබඳු විය යුතු ද යන්න පිළිබඳව ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව මගින් 2019 අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් 2019 සැප්තැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා ප්‍රකාශයට පත් කරන ලද මාධ්‍ය උපමානයන් අනුව සෑම මුද්‍රිත මාධ්‍යයක්ම යම් මැතිවරණයක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ දී මධ්‍යස්ථ සහ අපක්ෂපාතී විය යුතු බව මූලික යෝජනාව වේ

**මුඛ්‍ය පදඃ** *මුද්‍රිත මාධ්‍ය, 2019 ජනාධිපතිවරණය, මාධ්‍ය හැසිරීම*

[1] chamaleew@kln.ac.lk, ජනසන්නිවේදන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

[2] sameerak@kln.ac.lk, ජනසන්නිවේදන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# රාජ්‍ය ආයතන මගින් පරිපාලන කාර්යක්ෂමතාවය කෙරෙහි සමාජ මාධ්‍යයක් වන මුහුණු පොත භාවිතයට ගැනීම පිළිබඳ සමාජ අවබෝධය

*කේ. කේ. එස්. චතුරිකා [1], ඩබ්. ටී. කේ. ටී. සෙව්වන්දි [2]*

**සංක්ෂේපය**

වර්තමාන තොරතුරු සමාජ පද්ධතිය කෙරෙහි නව මාධ්‍යයේ ආගමනය සිදු වී ඇති අතර මානව සමාජය එහි පවතින වෙනස්කම් වෙත අනුවර්තනය වෙමින් පවතී. නව මාධ්‍ය සමාජ,ආර්ථික,සංස්කෘතික,දේශපාලන හා ආගමික ආදී සියලුම ක්ෂේත්‍ර කෙරෙහි බලපෑම් සිදු කිරීමට සමත් වී තිබේ. ඒ අනුව විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන ආයතන මගින් පරිපාලන කාර්යක්ෂමතාවය ඇති කරලීම සඳහා මුහුණු පොත යොදා ගැනීමක් දක්නට ලැබෙන අතර එම වැඩ පිළිවෙල සම්බන්ධයෙන් සමාජ දැනුවත්භාවය විමසීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. නියැදිය ලෙස බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තෝරා ගනු ලැබූ අතර එමගින් මුහුණු පොත හරහා ගෙන යනු ලබන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් විමසීමක් සිදු කරනු ලැබීය.බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ජීවත්වන්නන් වයස අවුරුදු 18ත් 30ත් හා 30ත් 60ත් අතර පසුවන්නන් තිස් දෙනෙකුගෙන් යුත් නියැදියක් තුළින් සම්මුඛ සාකච්ඡා සිදු කිරීම මගින් මුහුණු පොත හරහා ගෙන යන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් සමාජ දැනුවත්භාවය පිළිබඳ දත්ත රැස් කරගන්නා ලදී.රැස් කරගනු ලැබූ දත්ත Microsoft Excel මෘදුකාංගය ඔස්සේ විශ්ලේෂණය කරනු ලැබීය. එමගින් කරුණු කිහිපයක් අනාවරණය විය.නියැදිය ලෙස ගන්නා ලද වයස් කාණ්ඩ මත දැක්විය හැකි කාරණයන් ලෙස වයස අවුරුදු 18ත් 30 අතර පසුවන්නන් මෙන්ම 30ත් 60ත් අතර පසුවන්නන් මුහුණු පොත හරහා සැලකිය යුතු සේවාවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලබා ගන්නා බවත් එලෙස දැනුවත්භාවයක් ඇති පුද්ගලයන් අතරින් කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ සැලකිය යුතු අධ්‍යාපනයක් ලබා තිබීමයි. වයස් මට්ටම අනුව මුහුණු පොත පිළිබඳ ඇති දැනුවත්භාවය විමසීමක් සිදු කිරීමෙන් පසක් වූ කාරණය වූයේ අධ්‍යාපන මට්ටම අනුව දැනුවත්භාවයේ අඩු වැඩි වීමක් සිදු වී ඇති බවයි. කෙසේ නමුත් පරිපාලන කාර්යක්ෂමතාවය කෙරෙහි මුහුණු පොත භාවිතය පිළිබඳව සැලකිය යුතු මට්ටමේ සමාජ දැනුවත්භාවයක් දක්නට ඇති බව සඳහන් කළ හැකි අතර මෙවැනි වූ භාවිතයන් වැඩි දියුණු කිරීම මගින් කාර්යක්ශම පරිපාලන යාන්ත්‍රණයකට මෙන්ම රාජ්‍ය ආයතන මගින් ඉතා සමීප සේවාවක් මහජනතාවට ලබා දිය හැකිවනු ඇති බව නිගමනය කළ හැකි වේ.

**මුඛ්‍ය පද:** *මුහුණු පොත, පරිපාලන කාර්යක්ෂමතාවය, රාජ්‍ය ආයතන, සමාජ දැනුවත්භාවය, අධ්‍යාපන මට්ටම*

[1] kudaligamakapuge95@gmail.com, දේශපාලන විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

[2] thilankakalanig@gmail.com, දේශපාලන විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# පුස්තකාල පාඨකයින්ගේ තොරතුරු ගවේෂණ කුසලතා වර්ධනය කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලයේ දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්

*පී.බී. ඉරේෂා මධුමාලි* [1]

**සංක්ෂේපය**

විශ්වවිද්‍යාල පුස්තකාලය, විශ්වවිද්‍යාලයක හදවත ලෙස හඳුන්වන අතර එහි මූලික කාර්යයන් වන අධ්‍යාපනය, පර්යේෂණ ප්‍රකාශනය සහ දැනුම සංරක්ෂණය උදෙසා පුස්තකාලයෙන් විශාල දායකත්වයක් ලැබෙන්නාසේම අධ්‍යාපන කාර්යයට අවශ්‍ය සම්පත් එකතුව ගොඩනැගීම, සංවිධානය, පවත්වාගෙන යාම සහ වර්ධනය කිරීම මත පදනම් වී පුස්තකාල පාඨක වර්ගය මත රඳා පවතී. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ තොරතුරු ගවේෂණය කුසලතා වර්ධනය කිරීමේදී ශාස්ත්‍රීය පුස්තකාලයක් ශිෂ්‍යයාට කොතරම් දුරට සහාය වන්නේ ද යන ගැටළුව පදනම් කරගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදී. අධ්‍යයනයේ මූලික අරමුණු වූයේ කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් තුල තොරතුරු කුසලතා වර්ධනය කිරීමේ දී පුස්තකාලය විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් සහ ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේද මොනවාද යන්න ඇගයීම සහ ඒවායේ පවතින ගැටලු සහ අඩුපාඩු මොනවාද යන්න හඳුනාගැනිමත්, විද්‍යාර්ථීන්ගේ වර්තමාන තොරතුරු සෙවීමේ කුසලතා හඳුනාගැනිමත්ය. දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ලෙස ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යොදා ගත් අතර අහඹු නියැදිය යටතේ කාර්ය මණ්ඩල සේවකයින් 25 ක් සහ විද්‍යාර්ථීන් 100 මගින් දත්ත රැස් කරන ලදී. පර්යේෂණ සොයාගැනීම් අනුව උසස් අධ්‍යාපනය තුළ නිරතවන විද්‍යාර්ථීන් සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල කාර්යමණ්ඩලය විසින් තොරතුරු ගවේෂණය කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් වැඩසටහන් (විද්‍යාර්ථීන් අනුගත කිරීමේ නවක නම්නීකරණ වැඩසටහන්, පුස්තකාල දේශන, තොරතුරු ගවේෂණ ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්), පුස්තකාල චාරිකා, පුස්තකාල අත්පොත් ආදිය මගින් සහ මාර්ගගත ආකාරයෙන් ද දායකත්වය සපයන බව සොයා ගන්නා ලදී. නමුත් එම වැඩසටහන් සහ මඟ පෙන්වීම් පාඨකයා පොළඹවා ගැනිමට සහ පාඨකයා ආකර්ෂණය කර ගැනිමට සමත් නොවීම, සංකීර්ණ ගවේෂණ ක්‍රම පැවතිම, පාඨකයාට මාර්ගගත සූචිය පිළිබඳ දැනුවත්භාවයක් නොමැතිවිම ආදිය මෙහි දැකගත හැකි අඩුපාඩු වේ. පුස්තකාල දිශානති වැඩසටහන් මඟින් විද්‍යාර්ථීන්ට අවශ්‍ය මඟපෙන්වීම පුස්තකාල කාර්යමණ්ඩලය ලබා දුන් නමුත් විද්‍යාර්ථීන්ගේ කාර්යබහුල කාලසටහන් සමඟ ඒවාට සහභාගි විමට නොහැකි බව ද සොයාගන්නා ලදී. අධ්‍යයනය අවසානයේ ප්‍රස්තුත වූයේ තොරතුරු තාක්ෂණය සහ තොරතුරු බහුලතාවය හේතුවෙන් ඉතා පහසුවෙන් සහ ඉක්මනින් තොරතුරු වෙත ප්‍රවේශ විමට පුස්තකාල කාර්යමණ්ඩලය ප්‍රමාණවත් තරම් දායකත්වයක් දක්වන බවත් විද්‍යාර්ථීන් තුළ තොරතුරු ගවේෂණ ක්‍රම පිළිබඳ පුළුල් දැනුම් මට්ටමක් නොමැති බව සහ ඔවුන් පුස්තකාල භාවිතයට දක්වන ප්‍රමුඛතාවය අඩු බව සහ අන්තර්ජාලය තොරතුරු ගවේෂණය කිරීමේ ප්‍රධාන මාධ්‍ය බව අනාවරණය විය.

**මුඛ්‍ය පදඃ** *විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල පුස්තකාලය, පුස්තකාල සේවා, තොරතුරු තාක්ෂණය, තොරතුරු ගවේෂණ ශිල්ප ක්‍රම*

[1] madhumaliiresha80@gmail.com, පුස්තකාල හා විඥපනවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# මානව පුස්තකාල සංකල්පය ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය සඳහා යොදා ගැනිමේ වැදගත්කම අධ්‍යනය කිරිම : කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාලය , ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාලය හා අතුරුගිරිය මහජන පුස්තකාලය ඇසුරින්

කෞශල්‍යා විජේරත්න [1]

**සංක්ෂේපය**

කාලානුරූපිව පුස්තකාල පද්ධතියට නවින සංකල්ප රාශියක් පැමිණ ඇත. ඒ අනුව මෑතකදි පුස්තකාල ක්ෂේත්‍රයට පිවිසි ඉතා වැදගත් සංකල්පයක් ලෙස මානව පුස්තකාල සංකල්පය හඳුන්වා දිය හැකි ය. සජිවි මානව පොතක් හා සම්බන්ධ වි තම අදහස් හුවමාරු කර ගැනිමට මානව පුස්තකාල හරහා අවස්ථාව ලබා දි තිබේ. මෙමගින් කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාලය , ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාලය , අතුරුගිරිය මහජන පුස්කාල ඇසුරින් මානව පුස්තකාල සංකල්පය ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතියට යොදා ගැනිමේ ඇති වැදගත්කම අධ්‍යනය කිරිම මූලික අරමුණ විය. මෙහි පර්යේෂණ ක්‍රමය ලෙස සමීක්ෂණ ක්‍රමය භාවිතා කෙරිණි. සංගහණය ලෙස ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල හා මහජන පුස්තකාලයන් යොදා ගැණිනි . මෙහි අරමුණු සහගත නියැදිය භාවිත කරමින් කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාලය , ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාලය හා අතුරුගිරිය මහජන පුස්තකාලය තෝරාගෙන පාඨකයින් 150 ක් හා පුස්තකාලයාධිපතවරුන් 15 ක් හා කාර්යය මණ්ඩල 50 ක් සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලි, කණ්ඩායම් සාකච්ඡා සහ නිරික්ෂණ මගින් ද දත්ත එකතු කර ගන්නා ලදි. මෙහිදි මානව පුස්තකාල සංකල්පය ශ්‍රී ලංකාවේ පුස්කාල පද්ධතිය තුළ නිසි අයුරින් ව්‍යාප්ත වි නොමැති බව අනාවරණය විය . එසේම දැනට ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාලය , ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාලය , අතුරුගිරිය මහජන පුස්තකාලය තුළ පුස්තකාල වැඩසටහන් සාර්ථක ලෙස ක්‍රියාත්මක නොවන බව අනාවරණය විය. බෝහෝ පුස්තකාලාධිපතිවරුන් සම්ප්‍රදායික රාමුවකට සිමා වි සිටින බවත් නවින සංකල්ප තම පුස්තකාලය තුළ භාවිත කිරිමට ප්‍රියතාවයක් නොදක්වන බවත් , මානව පුස්තකාල සංකල්පය පිළිබඳව පුස්තකාලාධිපතිවරුන්ට ඇති අවබෝධය අවම බවත් අනාවරණය විය . මානව පුස්තකාල වැඩසටහන් සඳහා සහභාගිවිම සඳහා පාඨක උනන්දුව ද ඉහළ මට්ටමක පවතින බවත් අනාවරණය විය. පාඨකයින් වැඩි ප්‍රමාණයක් පොත්පත් පරිශිලනය වෙනුවට සජිවි පුද්ගලයෙකු සමඟ සම්බන්ධ වි තම අදහස් හුවමාරු කර ගැනිමට කැමැත්තක් දක්වනු ලැබේ. මානව පුස්තකාල සංකල්පය භාවිතයෙන් විදේශ රටවල් බෝහෝ ප්‍රයෝජන අත්පත් කර ගනු ලබයි. මෙවැනි වැඩසටහන් පුස්තකාලය තුළ ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරිම සඳහා සෙසු පුස්තකාලවලටද මෙම සංකල්පය හඳුන්වාදිමත් එහි ප්‍රයෝජන පැහැදිලි කිරිමත් ශ්‍රී ලංකා පුස්තකාල පද්ධතිය තුළ මෙම සංකල්පය ව්‍යාප්ත කිරිමත් ඉතාමත් වැදගත් වේ.

**මුඛ්‍ය පද:** පුස්තකාලය , තොරතුරු , මානවයා , මානව පුස්තකාලය , මානව පොත්

[1] erandakaushalya1@gmail.com, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යන අංශය , කැලණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාදාමය තුළ නායකත්ව ආධිපත්‍යය ගොඩනැගීම කෙරෙහි ජනමාධ්‍යයේ ක්‍රියාකාරිත්වය (2019 ජනාධිපතිවරණය ඇසුරින්)

*එම්. ඒ. එල් ලශාන්දිකා [1], ඩී. අයි. එච්. එස් පෙරේරා [2]*

**සංක්ෂේපය**

රටක් තුළ දේශපාලන නායකයන් බලයට පත්කිරීම සඳහා විවිධ සමාජ කණ්ඩායම්, ආයතන දෘෂ්ටිවාදි ලෙස ක්‍රියාත්මක වීම හඳුනා ගත හැක. එලෙස ක්‍රියාත්මක වන ආයතන අතරින් දේශපාලන ක්‍රියාවලිය තුළ මහජන මතයට ප්‍රබල බලපෑමක් කළ හැකි ආයතනයක් බවට ජනමාධ්‍ය පත් වී තිබේ. ජනමාධ්‍ය වූ කලී ජනතාවගේ එදිනෙදා ජීවිතය හා සම්බන්ධ අත්‍යවශ්‍ය කරුණක් බවට අද පත්ව තිබේ. එනම්, තොරතුරු දැනගැනීම, විනෝදාස්වාදය, පෙළඹවීම ආදී සෑම ක්‍රියාවලියක් කෙරෙහිම ජනමාධ්‍ය මඟින් කරනු ලබන බලපෑම දැකගත හැකි වේ. එහිදී ජනමාධ්‍ය මඟින් මහජන මතයට ආමන්ත්‍රණය කිරීමේ හැකියාව පවතින බව මෙරට පැවති පසුගිය මැතිවරණ ආශ්‍රයෙන් මැනවින් දැකගත හැකි විය. එමනිසා ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාදාමය තුළ නායකත්ව ආධිපත්‍යය ගොඩනැගීමට ජනමාධ්‍යයේ ක්‍රියාකාරීත්වය 2019 ජනාධිපතිවරණය ඇසුරින් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය හරහා සිදු කරන ලදි. එහිදී මෙම අධ්‍යයනය තුළින් නායකත්ව ආධිපත්‍යය යන්න ද ගෙනහැර දක්වනු ලබන අතර ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ නායකත්ව ආධිපත්‍යය කෙරෙහි දෘෂ්ටිවාදී ලෙස බලපෑම් කරනු ලබන විවිධ සමාජ ආයතන පැවතිය ද මෙම අධ්‍යයනයේ දී මූලික කර ගනු ලැබුවේ නොයෙකුත් ජනමාධ්‍යයන් අතරින් විද්‍යුත් මාධ්‍යයක් වන රූපවාහිනිය වේ. 2019 ජනාධිපතිවරණයේ දී නායකත්ව ආධිපත්‍ය ගොඩනැගීමට ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය හේතුවක් වී තිබේ ද? යන්න අපගේ පර්යේෂණ ගැටලුව වූ අතර ජනාධිපතිධූර අපේක්ෂකයින්ට ජනමාධ්‍ය මඟින් පක්ෂපාතිත්වය දක්වනු ලැබීමත්, මැතිවරණ ව්‍යාපාරයන්හි කරනු ලබන කතිකාවත් ජනමාධ්‍යය හරහා ප්‍රචාරය කිරීමත්, එමඟින් ඡන්දදායකයින් තුළ දේශපාලනික සවිඥානික බවක් ඇතිව ඇති ආකාරයත්, එය ජනාධිපතිවරණයේ දී සිය මනාපය පළ කිරීමේදී ඡන්දදායකයාගේ මතය හැඩගැස්වීමට බලපා තිබෙන බව සනාථ කිරීම මෙම පර්යේෂණයේ අරමුණු බවට පත් විය. මෙම අධ්‍යයනයේ දී ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යන දත්ත මූලාශ්‍රයන්ගෙන් තොරතුරු ලබා ගනු ලැබීය. එහිදී ප්‍රාථමික දත්ත මූලාශ්‍ර යටතේ ප්‍රශ්නාවලි මඟින් තොරතුරු රැස්කර ගනු ලැබූ අතර ද්විතීයික දත්ත උපයෝගී කර ගැනීමේදී පොත්පත්, සඟරා, ලිපි, අන්තර්ජාල මූලාශ්‍ර භාවිතා කරන ලදි. අධ්‍යයන ප්‍රදේශය කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන අතර එම කොට්ඨාසය තුළින් 60දෙනෙකු නියඳිය ලෙස තෝරා ගන්නා ලදි. මෙම පර්යේෂණය තුළින් ශ්‍රී ලංකාවේ 2019 ජනාධිපතිවරණයෙන් බලයට පත් ජනාධිපතිවරයා වටා නායකත්වය ගොඩනැගීමට ජනමාධ්‍ය දෘෂ්ටිවාදි ලෙස කටයුතු කර තිබෙන බව නිගමනය විය. නමුත් කුමන ආකාරයේ පක්ෂපාති අයුරින් තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලැබුවද ජනතාවට නිවැරැදි වූත්, සත්‍ය වූත් තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට ජනමාධ්‍ය දරණ ප්‍රයත්නය අතිවිශිෂ්ට බව කිව හැක.

**මූඛ්‍ය පද:** *ජනමාධ්‍ය, මහජන මතය, පාලකයන්, නායකත්වය, දේශපාලනය*

[1] lashandikaloshani@gmail.com, දේශපාලන විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

[2] isurihansika93@gmail.com, දේශපාලන විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# පෝස්ටර් ජායාරූපය, දේශපාලන ප්‍රතිරූපය හා මහජන සම්බන්ධතා (ශ්‍රී ලංකාවේ 2015 ජනාධිපතිවරණයට විශේෂිතව)

*ඩබ්ලිව්. ඒ. අයි. රූපසිංහ [1]*

**සංක්ෂේපය**

ලෝකයේ දේශපාලන ප්‍රතිරූප හා මහජන සම්බන්ධතා ගොඩනංවනු පිණිස භාවිත කරන නොයෙකුත් දෘශ්‍ය මාධ්‍යය ප්‍රචාරණ ක්‍රම අතර කටවුට්ස්, බිල්බෝඩ්ස් හා පෝස්ටර් ප්‍රමුඛ වේ. ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රතිරූප හා මහජන සමබන්ධතා ගොඩනැංවීමෙහිලා කටවුට්ස්, බිල්බෝඩ්ස් භාවිතයට වඩා පෝස්ටර් භාවිතය අධික වන අතර ඒ සඳහා මෙරට දේශපාලන සංස්කෘතිය තුළ දිගු ඉතිහාසයක් ඇත. පෝස්ටරය කටවුට්ස් හා බිල්බෝඩ්ස්වලට වඩා ප්‍රමාණයෙන් කුඩාය. ග්‍රාහක ආකර්ෂණය හා සන්නිවේදනය සඳහා කටවුට්ස්, බිල්බෝර්ඩ්ස් හා පෝස්ටර් තුළ ජායාරූප භාවිත කෙරේ. දේශපාලන ප්‍රතිරූප හා මහජන සම්බන්ධතා ගොඩනැංවීමට පෝස්ටර් ජායාරූපය භාවිතයේ ඇති යෝග්‍යතාවය කෙබඳුද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. එම කාර්යය සඳහා පෝස්ටර් ජායාරූපය භාවිතයේ යෝග්‍යතාවය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. පර්යේෂණ ක්‍රමවේදය ලෙස මිශ්‍ර ක්‍රමවේදය භාවිත කෙරිණි. පර්යේෂණයේ සීමාව ලෙස ශ්‍රී ලංකාවේ 2015 ජනාධිපතිවරණයේ අපේක්ෂකයින් වූ මෛත්‍රීපාල සිරිසේන හා මහින්ද රාජපක්ෂ යන ප්‍රධාන අපේක්ෂකයින්ගේ ප්‍රචාරණ කණ්ඩායම විසින් භාවිත කළ පෝස්ටර් ජායාරූප පමණක් පර්යේෂණයට භාජනය කෙරිණි. බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික්කවල අහඹු නියැදියක් ලෙස ඡන්දදායකයින් සිය දෙනෙකුට ගූගල් ප්‍රශ්නාවලී ලබා දීමෙන් පර්යේෂණය සඳහා දත්ත රැස්කෙරිණි. ප්‍රශ්නාවලිය, අන්තර්ගත විශ්ලේෂණය හා සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස්කර Spss හා Excel මෘදුකාංග ඔස්සේ දත්ත විශ්ලේෂණය කර නිගමනයට එළඹුණි. දේශපාලන ප්‍රතිරූප හා මහජන සම්බන්ධතා ගොඩනැංවීමට පෝස්ටර් ජායාරූපය යෝග්‍යතාවයක් නොදැක්වූ බව පර්යේෂණයේ අවසාන නිගමනය විය. දේශපාලනඥයින් අවංක මහජන සේවයට ප්‍රමුඛත්වය දී මහජන මතය ගොඩනැගිය යුතු බවත්, දේශපාලන ප්‍රතිරූප හා මහජන සම්බන්ධතා ගොඩනැංවීමට සමාජ මාධ්‍යය ආශ්‍රිත නව මහජන සම්බන්ධතා ක්‍රම භාවිතය හා ඒ සඳහා නිර්මාණශීලි ජායාරූප භාවිතය සිදු කළ යුතු බව පර්යේෂණයෙන් යෝජනා විණි.

**මුඛ්‍ය පදඃ** *පෝස්ටර්, පෝස්ටර් ජායාරූපය, දේශපාලන ප්‍රතිරූප, මහජන සම්බන්ධතා, මහජන මතය*

[1] amarupasinghe@gmail.com, ජනසන්නිවේදන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ඉන්දියානු සාගර කලාපය තුළ චීනයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ආර්. ජී. ඒ. ප්‍රසන්තිකා* [1]

**සංක්ෂේපය**

ලෝක දේශපාලනය තුළ ජාත්‍යන්තර සබඳතා, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, ආගමික යන විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ සලකා බැලීමේදී මූලෝපායික වශයෙන් වැදගත් ස්ථානයක් ලෙස ඉන්දියානු සාගර කලාපය හඳුනාගත හැකිය. ඉන්දියානු සාගර කලාපය දකුණු ආසියාවට පමණක් නොව මුහුදු  මාර්ග හරහා පෙරදිග හා අපරදිග සම්බන්ධ කරනු ලබන උපාය මාර්ගික වශයෙන් වැදගත් කලාපයක් වශයෙන්ද හඳුනාගත හැකිය. විවිධත්වයෙන් යුතු රාජ්‍ය ගණනාවක් ඉන්දීය සාගර කලාපයට අයත් වන අතර ගෝලීය වෙළඳාමේදී වැඩි ආර්ථික ශක්‍යතාවයක් ද ඉන්දියානු සාගර කලාපයට හිමිවේ. එනම් ලෝක වෙළදාමෙන් විශාල ප්‍රමාණයක් ඉන්දීය සාගරය හරහා සිදු වීමයි. එමෙන්ම උපාය මාර්ගික වටිනාකමක් ඉන්දියානු සාගර කලාපය සම්බන්ධයෙන් පැවතීම හේතු කොට ගෙන ආසියාවේ නැගී එන රාජ්‍යයක් ලෙස, චීනයේ වැඩි අවධානයට ලක් වී ඇත. ඉන්දියානු සාගර කලාපය තුළ චීනය විසින් බල ආධිපත්‍ය ව්‍යාප්ත කර ගැනීමේ ක්‍රියාවලිය හරහා ඉන්දියානු සාගර කලාපයේ කුඩා රාජ්‍යයන්ට හා ඉන්දියාවට එය අභියෝගයක් මෙන්ම තර්ජනයක් වන ආකාරය විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. පර්යේෂණයේ අරමුණු ලෙස, චීනයේ ක්‍රියාකාරිත්වය නිසා ඉන්දියන් සාගර කලාපය තුළ පවතින කුඩා රාජ්‍යයන්ගේ පැවැත්ම සම්බන්ධව ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය වී තිබීම අධ්‍යයනය කිරීමත්, දකුණු ආසියානු බලවතා ලෙස ඒ සම්බන්ධව ඉන්දීය මැදිහත්වීම කෙසේද යන කරුණු අරමුණු කර ගනී. පර්යේෂණ දත්ත සපයා ගැනිම ද්විතියික මූලාශ්‍ර මත පදනම්ව විස්තරාත්මක ක්‍රමවේදය භාවිතා කරමින් ඉදිරිපත් කර ඇත. පර්යේෂණය තුළින් සනාථ වූයේ, ඉන්දියන් සාගර කලාපය තුළ චීනය තම බලය ව්‍යාප්ත කර ගැනීමේ උත්සහයක නිරත වන බවත් එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ඉන්දියන් සාගරය හා සම්බන්ධ කුඩා රාජ්‍යයන් වෙත සංවර්ධන ආධාර සැපයීම හා ආයෝජන පවත්වා ගෙනයාම ආදී ක්‍රියාමාර්ග ඔස්සේ චීනය විසින් එම රාජ්‍ය භාවිතයට ගනු ලබන බවත්, ඉන්දියාව චීනයේ බලයට අභියෝගකාරී ලෙස තම බලය ඉන්දියන් සාගරය තුළ ව්‍යාප්ත කර ගැනීම සඳහා නියැලෙන බවත්ය. තවද, චීනය විසින් මුහුදු මාර්ග ඔස්සේ  චීනයට වාසිදායක වූ ව්‍යාපාර සිදු කරන අතර මැදපෙරදිග සිට අප්‍රිකානු ප්‍රදේශයන්ට ව්‍යාපාර මෙහෙය වීමේදි චීනය ඉන්දියන් සාගර කලාපය බහුලව භාවිතා කොට ඇත. එම නිසා ඉන්දියානු සාගර කලාපය තුළ බලවත් ඉන්දියාව, ප්‍රබල අභියෝගයකට මෙන්ම තර්ජනයකට මුහුණ දී ඇත. එමෙන්ම ඉන්දියන් සාගරය හා බද්ධ කුඩා රාජ්‍යයන්ගේ බලවත් වරායන් චීනය සූක්ෂමව නතු කර ගැනිම ද දක්නට ලැබේ. එය චීනය විසින් මුතු ඇමිණීමක් සිදු කිරිම වශයෙන් හඳුන්වනු ලැබේ.

**මුඛ්‍ය පදඃ** *ඉන්දියානු සාගර කලාපය, චීනය, ඉන්දියාව, කුඩා රාජ්‍යයන්, ක්‍රියාකාරිත්වය*

[1] amashaliuok@gmail.com, දේශපාලන විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# තොටයක් සමයම මගින් සමාජයට ලැබෙන්නාවූ සන්නිවේදනය හා උපදේශනය

*සී. එම්. රමිත් ප්‍රේෂාල් චන්ද්‍රසේකර* [1]

**සංක්ෂේපය**

තොටයක් සමයම ශාන්තිකර්මය ඌව පළාත හා ඊට තදාශ්‍රිත මහඔය, පදියතලාව, නාමල්ඔය, අරන්තලාව, සේරන්කඩ යන ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්තව පවතී. මෙය හුදෙක් කාන්තා පාර්ශවය උදෙසා පවත්වනු ලබන ශාන්තිකර්මයක් වේ. තොට යක්ෂයාගේ ඇල්ම බැල්ම හේතුවෙන් කාන්තාවන් හට ඇතිවන උපද්‍රව දුරු කිරීමෙහිලා මෙම ශාන්තිකර්මය පැවැත්වේ. නමුත් මෙම ශාන්තිකර්මයේ අන්තර්ගත පද්‍ය සාහිත්‍යය හා චාරිත්‍ර  විමර්ශනයේ දී ප්‍රකට වන්නේ මෙම ශාන්තිකර්මය මගින් උපදේශන මාලාවක් සන්නිවේදනය වන බව ය. තොටයක් සමයම ශාන්තිකර්මය මගින් සමාජයට උපදේශනයක් සන්නිවේදනයක් වන්නේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස ඌව හා ඊට තදාසන්න ප්‍රදේශයන්හි තොටයක් සමයම පවත්වනු ලබන පාරම්පරික ශිල්පීන්ට අයත් ප්‍රාථමික, ද්විතීක මූලාශ්‍රය අධ්‍යයනය කරන ලදි. තව ද ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් මෙම ශාන්තිකර්ම ප්‍රායෝගිකව නිරීක්ෂණය කරන ලද අතර පාරම්පරික ශිල්පීන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා මගින් ද පර්යේෂණයට අවශ්‍ය දත්ත රැස් කරගන්නා ලදි. එසේ රැස්කරගත් දත්ත විශ්ලේෂණයේ දී මෙම කරුණු අනාවරණය විය. අතීතයේ සමාජ ඇසුරක් නොමැතිව සාමාන්‍ය දැනුමකින් තොර ස්ත්‍රීන්, පුරුෂයන් පිටිසරබද පළාත ආශ්‍රිතව ජීවත් විය. ඔවුන්ට ලිංගික ජීවිතය පිළිබඳ උපදෙස් දීමට දෙමාපිය වැඩිහිටියෝ ඉදිරිපත් නොවිණි. තොටයක් සමයම මගින් නව යොවුන් තරුණියන්ටත්, අඹු සැමියන් හටත් සාර්ථක ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වන උපදේශන චක්‍රව සන්නිවේදනය කරනු දැකගත හැකි වේ. යෞවනියන් හැසිරිය යුතු ආකාරය, ගමන් බිමන් යා යුතු ආකාරය, ආහාර ගත යුතු ආකාරය පිළිබඳව උපදේශ තොටයක් ශාන්තිකර්මයේ ඇතුළත් මගින් බලි පදය ප්‍රකට වනු දක්නට ඇත. විවාහ ජීවිතයට ඇතුළත් වන කාන්තාවන් හට සාර්ථක විවාහ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වන උපදේශන තොටයක් සමයම මගින් සමාජයට සන්නිවේදනය කරනු දක්නට ලැබේ. මෙම ශාන්තිකර්මයේ ඇතුළත් නානුමුරය මගින් කාන්තාවක් පිරිසිදු විය යුතු ආකාරය, කපු කැටීම මගින් තම පුරුෂයා සමඟ සබඳතා පැවැත්විය යුතු ආකාරය, දරු වැදීමේ දී දරුවකු බිහි කරන අයුරු හා වින්නඹු මවගේ කාර්ය පිළිබදවත්, දරු නැළවීම මගින් කුඩා දරුවකු නළවන ආකාරයත්, ගිරි යකිනි කවි මගින් ළඳරුවෙකුට ඇතිවිය හැකි උපද්‍රව පිළිබඳ පූර්ණ උපදේශනයක්  සෞන්දර්යාත්මකව සමාජයට සන්නිවේදනයක් කෙරෙනු දක්නට ඇත. මෙම පර්යේෂණයන්ට අනුව තොටයක් සමයම මගින් සෞන්දර්යාත්මකව සමාජයට උපදේශන මාලාවක් සන්නිවේදනය වන බව නිගමනය කළ හැකි වේ.

**මුඛ්‍ය පදඃ** *උපදේශනය, ඌව පළාත, තොට යකා, තොටයක් සමයම, පද්‍ය*

---

[1] ramithpreshal04@gmail.com, කැලණිය විශ්වවිද්‍යාලය

# සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් තුළ නව යටත්විජිතවාදය හේතුවෙන් පර්යාසයන්ට බඳුන් වු ක්ෂේත්‍ර පිළිබඳ විමර්ෂණාත්මක අධ්‍යයනයක්

එච්. ඒ. සි. ඩි.කුමාරි [1]


## සංක්ෂේපය

සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින සමාජ ,ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍ර කෙරෙහි මැදිහත්වීම ඉලක්කකොට ගත් ක්‍රියාවලිය නව යටත්විජිතවාදය ලෙස හඳුන්වයි. ලෝකයේ සම්පත් බෙදාහැරීම සහ සම්පත් හිමිකම පදනම් කොට ගෙන සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් ලෙස වර්ගීකරණයකට ලක් කර ඇත. මෙහි අරමුණ වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි නව යටත්විජිතවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන ආකාරයත් එහි බලපෑම නිසා එම රටවල්වල සිදූ වී ඇති පරිවර්තනයන් පිළිබඳව විමර්ෂණය කිරීමයි. පර්යේෂණය සඳහා පාදක වන අධ්‍යයන ගැටළුව වනුයේ, සංවර්ධනය වෙමින් පවතින රටවල සමාජ,ආර්ථික හා දේශපාලන සබඳතාවන් තීරණය කිරිමෙහිලා නව යටත්විජිතවාදය බලපෑම් කරන්නේ කෙසේද? යන්න වේ. මේ සඳහා ද්විතියික දත්ත උපයෝගී කරගත් අතර දත්ත සපයා ගැනීමේදී සංවර්ධනය වෙමින් පවකින රටවල් පිළිබඳව,දකුණු ආසියානු කලාපය මෙන්ම නව යටත්විජිතවාදය සම්බන්ධයෙන් පළ කරන ලද පොත්පත් ,පර්යේෂණාත්මක ලිපි මෙන්ම වෙබ් පිටු ද භාවිතා කරන ලදී. දත්ත විශ්ලේෂණය විස්තරාත්මක හා සන්සන්දනාත්මක ක්‍රමවේද උපයෝගි කරගන්නා ලදී. මෙහිදි අනාවරණය කර ගත හැකි කාරණා වුයේ, නව යටත්විජිතකරණය වු කලී යටත්විජිතකරණයේ නව්‍ය ස්වරූපය වන බවත් එය ක්‍රියාත්මක විමේදී ,බහුජාතික සමාගම් , ණය සහ ආධාර , දේශපාලන මැදිහත්වීම හා යුධමය මැදිහත්වීම් යන ප්‍රවේශ ප්‍රධාන වශයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල ක්‍රියාත්මක වන බවත්, සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික කටයුතු සිදු වන්නේ පිටස්තර අවශ්‍යතා සපුරා ගැනීමටකට යටත්ව වන බවත් විදේශ අරමුදල් සහ බහුජාතික සංස්ථාවන් මිනිස් ශ්‍රමය සූරා කන අතර රටක තිබෙන අමුද්‍රව්‍යය ඉතා අඩු මිලදී ගැනීමකට යටත්ව සිදු කරන බවත් හා දේශපාලන වශයෙන් තමන්ට වාසි දායක තත්ත්වයන් ඇති කිරිම සඳහා කටයුතු කරන බවත්ය. ඒ අනුව නිගමනය කළ හැක්කේ නව යටත්විජිතවාදය ඉතා උපක්‍රමශිලිව වක්‍රාකාරයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල ක්‍රියාත්මක වන බවත් එම නිසාවෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල සමාජ, ආර්ථික, දේශපාලන , පාරිසරික , සෞඛ්‍යමය හා සංස්කෘතික යනාදී වශයෙන් විවිධ අභියෝග නිර්මාණයවීමෙන් දරුණු බිඳ වැටිමකට ලක් වි ඇති බවයි.


***මූඛ්‍ය පද*** *: සංවර්ධිත රටවල්, සංවර්ධනය වෙමින් පවතින රටවල්, නව යටත්විජිතවාදය*

[1] devikakumari376@gmail.com, දේශපාලන විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# රූපවාහිනියේ සංස්කෘතික බලපෑම

*ඩී. එන්. වීරසිංහ [1], එම්. ජී. රශ්මි තාරුකා [2]*

**සංක්ෂේපය**

විසිවන සියවසේ සිදු වූ වඩාත් සුවිශේෂී වූ සමාජීය සිද්ධිය නම් රූපවාහිනිය හඳුන්වාදීමය. වර්තමානය වන විට රූපවාහිනිය සමාජානුයෝජනයේ ප්‍රබල නියෝජිතයෙකු බවට පත් වී අවසානය. පාරිභෝගික සමාජානුයෝජනය සඳහා රූපවාහිනියේ බලපෑම අතිවිශාල කරුණකි. මෙහිදී පර්යේෂණ ගැටලුව ලෙස යොදාගන්නා ලද්දේ, රූපවාහිනිය මඟින් දේශීය සංස්කෘතියට බලපෑමක් එල්ල වී තිබේද? යන්නය. රූපවාහිනිය සංස්කෘතියට කවරාකාරයේ බලපෑමක් එල්ල කර තිබේද යන්න මෙම පර්යේෂණයේ අරමුණ වේ. රූපවාහිනිය තුළ දැන්වීම කලෙක පටන් අපගේ සංස්කෘතියෙහි අනිවාර්ය සහ නිරායාස අංගයක් බවට පත්ව තිබෙන බව ද නොරහසකි. එය ශ්‍රී ලාංකික අනන්‍යතාවයටද බලපෑමක් එල්ල කර ඇත. වර්තමානය වන විට සංස්කෘතික විසරණය හා සංස්කෘතික සම්පර්කය වී ඇති ආකාරය දක්නට ලැබේ. එනම් වර්තමානය වන විට රූපවාහිනිය සරල දැන්වීමකින් පවා ගෝලීයකරණය තුළින් අපගේ සංස්කෘතියට බලපෑමක් එල්ල කර බටහිරකරණය අත්පත් කර ගැනීමට සමත් වී තිබෙන අතර වර්තමානය වන විට සංස්කෘතිය නෙරපා දැමීමට සමත් වූ කරුණක් ලෙස සමාජ ගත වී ඇත. අප රූපවාහිනියේ සංස්කෘතික බලපෑම කෙතරම් දුරට සමාජයට බලපෑම් එල්ල කළේ ද යන්න සිදු කරනු ලබන පරීක්ෂණයේදී පර්යේෂණයට භාජනය කරනු ලැබුවේ කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ සියලුම විද්‍යාර්ථීන්ය. සංගහණනය සෑම නියැදුම් ඒකකයකටම නියැදියට ඇතුලත් වීම සඳහා සමාන සම්භාවිතාවයක් ලැබෙන පරිදි ඒකකයන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය වන සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ පාලන නියැදියක් ලෙස සිසුන් ඇතුලත් වන පරිදි නියැදිය තෝරා ගන්නා ලදී. ඔවුන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිත කර එමගින් ලැබෙන්නා වූ දත්ත මධ්‍යයනය, ප්‍රතිශතය වැනි විශ්ලේෂණාත්මක ක්‍රම භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණ දත්ත වලට අනුකූලව නිගමනය කල හැකි වූයේ, රූපවාහිනියේ සංස්කෘතික බලපෑම සංස්කෘතික සම්පර්කයන් දක්වා සමාජයට අහිතකර බලපෑමක් එල්ල වී තිබෙන අතර එතුළින් දේශීය සංස්කෘතිය විනාශ වී ගොස් තිබේ. එම ගැටලුව වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය තහවුරු කරන පැරණි සංස්කෘතියට ද නොවැළැක්විය හැකි ලෙසින් බලපෑම් එල්ල කර ඇත.

**මුඛ්‍ය පදඃ** *සමාජානුයෝජනය, සංස්කෘතික විසරණය, බටහිරකරණය, මනෝභාවය, සංස්කෘතික සම්පර්කය*

[1] nishadidilmi519@gmail.com, ජනසන්නිවේදන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

[2] rashu.97tharu@gmail.com , ජනසන්නිවේදන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# මෑත කාලීන ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ ප්‍රජා ගුවන්විදුලියේ භාවිතය

*ආර්. එන්. එම්. තෙන්නකෝන්* [1]

**සංක්ෂේපය**

කිසියම් රටක් සංවර්ධනය සඳහා යන ගමනේ දී ප්‍රජා මාධ්‍ය භාවිත කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැකිය. ශ්‍රී ලංකාවේ ප්‍රජා ගුවන්විදුලි මාධ්‍ය ආරම්භ කරනු ලබන්නේ මහවැලි කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිය මගින් ප්‍රජාව නැවත පදිංචි කිරීමේදී ඔවුන්ව සවිබල ගැන්වීම අරමුණු කොටගෙනය. නූතන ශ්‍රී ලාංකේය සංවර්ධන ක්‍රියාවලිය සඳහා ප්‍රජා ගුවන්විදුලිය දායක කරගැනීම සම්බන්ධව මෑතකාලීනව පර්යේෂණ අධ්‍යයනයන් සිදු වී නොමැත. එම නිසා මෙරට සංවර්ධනයට ප්‍රජා ගුවන්විදුලිය දායක කරගත හැකිද? යන්න සොයා බැලීම කාලීන අවශ්‍යතාවයකි. පර්යේෂණයේ මූලික අරමුණු ද්විත්වය වන්නේ, නූතන ශ්‍රී ලාංකේය සංවර්ධන ක්‍රියාවලිය සඳහා ප්‍රජා ගුවන්විදුලි මාධ්‍ය දායක කරගත හැකි ආකාරය පිළිබඳ විමර්ශනය කිරීම සහ නූතන සංවර්ධන සංදේශ ග්‍රාහකයා වෙත ගෙනයාමේදී ප්‍රජා ගුවන්විදුලිය අනුගමනය කරන ක්‍රමවේදය අධ්‍යනය කිරීමයි. පර්යේෂණ උපන්‍යාසය වූයේ නූතන ශ්‍රී ලාංකේය සංවර්ධන ක්‍රියාවලිය සඳහා ප්‍රජා ගුවන්විදුලිය දායක කරගැනීමට හැකියාව ඇති බවයි. මිශ්‍ර ක්‍රමවේදය යටතේ සිදුකරන ලද මෙම පර්යේෂණයේදී දත්ත රාශිකරණ ක්‍රමවේදයන් ලෙස සාහිත්‍ය මූලාශ්‍ර විමර්ශනය, ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලිය, සහ ප්‍රජා ගුවන්විදුලි වැඩසටහන් සංරක්ෂිත හඬපට භාවිත කරන ලදී. ප්‍රශ්නාවලිය මගින් දත්ත ලබා ගැනීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා ඌව සහ දඹාන ප්‍රජා ගුවන්විදුලි නාලිකා ශ්‍රාවකයන් අතුරින් සියදෙනෙකුගෙන් යුත් නියැදියක් භාවිත කරන ලදි. පර්යේෂකයාගේ බුද්ධිය මත පදනම්ව සහ ී මෘදුකාංගය භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණයේ එක් ප්‍රතිඵලයක් ලෙස ප්‍රජා ගුවන්විදුලි ශ්‍රවණ කලාපීය ජනතාවගේ සන්නිවේදන අවශ්‍යතාවයන් ඉටුකරගැනීම සඳහා රූපවාහිනීමාධ්‍ය භාවිතා කරන පිරිස 70% ට වඩා වැඩි බව අනාවරණය විය. ඒ අනුව ගුවන්විදුලි මාධ්‍ය ග්‍රාහකයාගෙන් ඈත්ව තිබෙන ආකාරයක් හඳුනාගත හැකිය. ගුවන්විදුලි මාධ්‍යයට සවන්දෙන සුළුපිරිස අතරිනුත් ඌව සහ දඹාන ප්‍රජා ගුවන්විදුලියට සවන්දෙන පිරිස 68%කි. සමස්ත ගුවන්කාලය සැළකූවිට නූතන සංවර්ධන ඉලක්ක සපුරාගැනීම අරමුණු කරගනිමින් ප්‍රජා ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදනය වන්නේ ගුවන් කාලයෙන් 2% වැනි අවම කාලයකි. මෙවැනි අභියෝගයන් හමුවේ වුවද ප්‍රජා ගුවන්විදුලිය සතු නවීන තාක්ෂණික පහසුකම් සහ ප්‍රමාණවත් මානව සම්පත හේතුවෙන් ප්‍රජා ගුවන්විදුලිය සංවර්ධන අභිමතාර්ථයන් ඉටු කරගැනීම සඳහා භාවිත කිරීමේ හැකියාව පවතී. බහතුරයක් ග්‍රාමීය ජනතාව වෙසෙන මෙරට සංවර්ධන ඉලක්කයන් සපුරාගැනීමට යාමේ දී, ප්‍රජා ගුවන්විදුලි මාධ්‍ය වැඩසටහන් අන්තර්ගතය සහ ආකෘතිය නූතන සංවර්ධන අවශ්‍යතා අනුව සකස් කළ යුතුය. ප්‍රජාවගේ ජීවන තත්ත්වයන් අවබෝධ කරගනිමින් වැඩසටහන් නිෂ්පාදනය කිරීමටත්, ඔවුන් ඒ සඳහා සක්‍රීයව දායක කරගැනීමටත් මෙහි දී යෝජනා කෙරේ.

***මුඛ්‍ය පද:*** *සංවර්ධනය, ජන මාධ්‍ය, සංවර්ධන සන්නිවේදනය, ප්‍රජා ගුවන්විදුලිය, ප්‍රජාව*

[1] niranjan199027@gmail.com, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

# චිත්‍රපට දැන්වීම්කරණයේ ඡායාරූපමය භාවිතය (තෝරා ගත් ශ්‍රී ලාංකීය චිත්‍රපට කිහිපයක පෝස්ටර් දැන්වීම්වලට විශේෂිතව)

*කේ. ඒ. එන්. දුලාංජලී* [1]

**සංක්ෂේපය**

වර්තමානය වන විට සිනමාව කලාවක් පමණක් නොව, ප්‍රධාන ධාරාවේ කර්මාන්තයක් බවට ද පත් වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස චිත්‍රපට වෙළඳපොළක් බිහිවී ඇති අතර චිත්‍රපට නිර්මාණකරුවන්ට එකී වෙළඳපොළ තරගකාරීත්වයට මුහුණ දීමට සිදු වී ඇත. එනිසා චිත්‍රපටයක් ප්‍රේක්ෂකයා වෙත ගෙන යාමේදී ප්‍රචාරණ සැලැසුමක් අනුව කටයුතු කිරීමට ද සිදු වී ඇති අතර එවැනි සැලැසුම් අතර චිත්‍රපට පෝස්ටරයට ප්‍රමුඛතාවයක් ලැබී ඇත. මෙම අධ්‍යයනයේ මූලික අවධානය යොමු කර ඇත්තේ චිත්‍රපට පෝස්ටර් නිර්මාණයයට යොදාගන්නා නිශ්චල ඡායාරූප සම්බන්ධවයි. 'ශ්‍රී ලංකාව තුළ බිහිවන චිත්‍රපට සඳහා නිර්මාණය කරන පෝස්ටර් දැන්වීම්වලට යොදා ගැනෙන ඡායාරූප මගින්, චිත්‍රපටයේ අන්තර්ගතය හෝ සංක්ෂිප්තය නිසි පරිදි ප්‍රේක්ෂකයාට සන්නිවේදනය වේ ද?' යන පර්යේෂණ ගැටලුව පාදක කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. ජාතික චිත්‍රපට සංස්ථාවේ දළ ආදායම් වාර්තාවන්ට අනුව 2015 සිට 2018 දක්වා වසරවල ඉහළ ආදායම් ලැබූ චිත්‍රපට අතුරින්, ශානර 5 ක් නියෝජනය වන සේ චිත්‍රපට 5 ක් පර්යේෂණය සඳහා යොදා ගත් අතර එම චිත්‍රපටවල පෝස්ටරයේ ඇති ඡායාරූප හා චිත්‍රපට අන්තර්ගතය අතර සම්බන්ධය විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කරන ලදි. ප්‍රශ්නාවලිය සඳහා නියැදිය වශයෙන් අහඹු නියැදි ක්‍රමයට 50 දෙනෙකු තෝරා ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා සඳහා නියැදිය තෝරා ගනු ලැබුවේ, තෝරාගත් චිත්‍රපටවල අධ්‍යක්ෂකවරුන්, නිශ්චල ඡායාරූපය ශිල්පීන්, ග්‍රැෆික් නිර්මාණකරුවන් සහ සිනමා ක්ෂේත්‍රයේ විෂය ප්‍රවීණයන්ය. රැස් කර ගත් ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය හරහා ද ගුණාත්මක දත්ත ගුණාත්මක විශ්ලේෂණය හරහා ද විශ්ලේෂණය කරන ලදි. බහුතරයක් ශ්‍රී ලාංකික චිත්‍රපට පෝස්ටර් සඳහා යොදා ගන්නා ඡායාරූප, චිත්‍රපටයේ අන්තර්ගතය හෝ සංක්ෂිප්තය නිරූපණය කරන ඒවා නොවන බවත්, ඒ වෙනුවට චිත්‍රපටයේ ප්‍රධාන චරිතයකට රංගන දායකත්වය ලබා දෙන ජනප්‍රිය රංගන ශිල්පියෙකු හෝ ශිල්පිනයක නිරූපණය වන ආකාරයෙන් හෝ නැතිනම් චිත්‍රපටය විසින් ඉලක්ක කරන ලද ප්‍රේක්ෂක ප්‍රජාව වඩාත් ඉක්මණින් ආකර්ෂණය කර ගැනීමේ සන්නිවේදනාත්මක ශක්‍යතා සහිතව පෝස්ටර් නිර්මාණය කර ඇති බවත් පැහැදිලි විය. පෝස්ටර් මගින් චිත්‍රපටයේ අන්තර්ගතය හෝ සංක්ෂිප්තය නිරූපණය වී ඇති අවස්ථාවලදීට වඩා ජනප්‍රිය රංගන ශිල්පියෙකු හෝ ශිල්පිනයක නිරූපණය වන ආකාරයෙන් පෝස්ටර් නිර්මාණය කර ඇති අවස්ථාවලදී එම පෝස්ටර් ප්‍රේක්ෂකයාගේ මතකයේ රැඳී ඇති බව ද තහවුරු විය.

**මුඛ්‍ය පද:** *චිත්‍රපට දැන්වීම්කරණය, ඡායාරූපකරණය, පෝස්ටර් දැන්වීම්, චිත්‍රපට අන්තර්ගතය, ප්‍රේක්ෂක ආකර්ශනය*

[1] nadeerand28@gmail.com, ජනසන්නිවේදන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# *STATISTICS AND SOCIAL SCIENCES*

# Factors affecting the profitability of small-scale gem mining industry (Based on Kuruwita divisional secretariat in Rathnapura district)

*D. G. A. M. Wickramanayaka[1] , Prof. G. M. Henegedara [2]*

## Abstract

Gem industry, which is highly developed through the advancement of technology, has increased Sri Lanka's foreign exchange. By 2017, Sri Lanka has received a total of 22,075 million Rupees. This is a very high contribution of 99.85% of the total mineral exports to Sri Lanka (Economic and Social Statistics of Sri Lanka, 2018). Small-scale gem miners have very important part of this industry. The goal of small scale gem miners to get into the gem industry is to improve their quality of life. However, the profit earned by the miners is not enough to sustain the small scale gem mining business as a profitable business. Accordingly, the study aims to find out what factors are driving the small scale gem mining business as a profitable venture. The purpose of this study was to study the problems faced by small scale gem miners today. As the study area, the Kuruwita Divisional Secretariat in the Ratnapura District and 50 small scale gem miners in the two Grama Seva Divisions of Ihalagama / Theppanawa and Pathagama in this Divisional Secretariat were selected as the study sample. This study is mainly based on primary data. Data were analyzed using quantitative and qualitative analysis methods using a structured questionnaire. The results of the chi-Squared test revealed that the level of experience, technology, and investment potential (capital) influence the small-scale gem mining business as a profitable venture and level of education does not influence in the small-scale gem mining business as a profitable venture. It was also revealed that there were problems with the availability of raw materials, labor, licensing, mechanical technology and the gem market. Proposals to provide practical knowledge, financial support and marketing facilities to promote the value of small scale gem mining among the younger generation can be proposed.

**Key words:** small-scale gem mining, small-scale gem miners, profitability

[1] ayeshaamadumali@gmail.com, Department of Economics, University of Kelaniya.
[2] mahinta2002@yahoo.com, Department of Economics, University of Kelaniya.

# Covid – 19 Pandemic and Unemployment in Sri Lanka

*M.G.D.L Weerasinghe [1], Y.I Madhuwanthi [2], P.R Wijemanna [3]*

**Abstract**

The Covid-19 pandemic also known as the corona virus pandemic, is an ongoing pandemic of in the world. This pandemic has affected economic and social activities all over the world. There are lot of countries have locked down their economies. Unemployed persons available and/or looking for work, and who did not work and taken steps to find a job during last 4 weeks and ready to accept a job given a work opportunity within next two weeks are defined as unemployed. Unemployment is a key measure of economic health. Sri Lankan labor force has 8.6 million of economically active population in the 4th quarter of 2019.Because of this pandemic employment protection has been threatened and the loss of income. The problem is how to affect Covid -19 pandemic to unemployment in Sri Lanka? Objectives of this study, is to identify the relationship between these two, how this situation affects to Sri Lankan economy, due to the impact of new trade routes, export import orientation, international trade and advancement of new transportation system we as a country experience the impact of globalization. In this study, primary data from questionnaire and secondary data from quarterly data reports of Census and Statistics department, Sri Lanka have used to this study and used descriptive statistics for represent data and used some statistical data packages for data analysis.The challenge that Sri Lanka faces now is that how to take control over economy regenerated employment opportunities and take relevant measures protect existing employment in the labor market through proper labor market reforms. As a result of this study we found the unemployment rate got increased because of the pandemic and these two have positive relationship. The final conclusion is that the objectives have been achieved.

**Key Words:** *Covid – 19, pandemic, unemployment, labor force, Economy*

[1] dilweer996h@gmail.com, Department of Economics, University of Kelaniya.

[2] ishi.madhuwanthi@gmail.com, Department of Economics, University of Kelaniya.

[3] pasindu96wijemanna@gmail.com, Department of Economics, University of Kelaniya.

# The impact of Covid-19 outbreak on the tourism industry in Sri Lanka

*W. C. L.Weerakkody* **[1]**

**Abstract**

Covid-19 outbreak started in Wuhan, China, in December of 2019. The WHO declared the Covid-19 outbreak as a pandemic on 11th of March 2020. With the spread of Covid-19 all over the world, considerable number of patients were identified in Sri Lanka. The Covid-19 outbreak in Sri Lanka affected tourism industry. Tourism industry can be considered as the main path of income in Sri Lanka. The objectives of the research are identifying the impacts of Covid-19 outbreak for the tourism industry in Sri Lanka, considering about the effects on the whole economy which were caused by the tourism industry, and paying attention to the actions that are implementing by the relevant parties. All the tourist hotels in the Sri Lanka are considered as the population and five hotels selected randomly which are in Colombo district. The research is based quantitative data and those data are collected as secondary data. The collected data were analyzed using SPSS software and chi square test, and Anova model are used to analyze data. With the Covid-19 outbreak, the arrivals of foreign passengers were reduced and finally the airport is closed. The government and other parties take actions and imposing new rules on the tourism industry and the tourists' hotels are implementing some relevant actions to reconstruction of the tourism industry. According to the research, the Covid-19 affect to tourism industry badly and thereby the main income source of Sri Lanka has collapsed. Finally, according to the research it can be concluded that Sri Lankan tourism industry has faced large losses with the effects of Covid-19, and it can be reconstructed by implementing relevant actions.

**Key words:** *Covid-19, Tourism industry, Tourists, Sri Lanka, Reconstruction.*

[1] chathurikalakshani97@gmail.com, Department of Social Statistics, University of Kelaniya.

# ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කෙරෙහි covid 19 හි බලපෑම

*ඩී. පී. ඒ. එම්. වික්‍රමනායක* [1]

**සංක්ෂේපය**

ලොව පුරා ව්‍යාප්ත වෙමින් පවතින covid 19 වෛරසයෙන් පීඩාවට පත් මැදි ආදායම් ලබන රටක් ලෙස ශ්‍රී ලංකාව හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා දෙන කර්මාන්ත අතරින් තෙවැනි විශාලතම ව්‍යාපාරය වන්නේ සංචාරක කර්මාන්තයයි. 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීම 60%කින් අඩු වී ඇත. එසේම මෙම කාලය තුළ විශාලතම සංචාරක ප්‍රභව වෙළෙඳපොළ ඉන්දියාව බවට පත්ව තිබෙන අතර ශ්‍රී ලාංකිකයන් 95%ක් පමණ ශ්‍රී ලංකාවට ගුවන් මගින් පැමිණ ඇත (SRTDA, 2020). ශ්‍රී ලංකා ආර්ථිකය ඇමරිකානු ඩොලර් බිලියන 84ක් වන අතර එයින් 5%ක් ම සංචාරක ව්‍යාපාරය මත රඳා පවතී. මිලියන 22ක ජනගහනයෙන් මිලියන 2කට අධික ජනතාවක් සෘජුව හෝ වක්‍රව සංචාරක කර්මාන්තයේ නියැළී සිටින අතර එය ආර්ථිකය සමඟ ප්‍රතිලෝම වේ (රණසිංහ. ආර්, 2020). සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ එම සෘජු හා වක්‍ර රැකියා ප්‍රමාණය සමස්ත ශ්‍රම බලකායෙන් 4.6%කි. ඒ අනුව covid 19 වෛරසය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කෙරෙහි ඇති කර තිබෙන බලපෑම අධ්‍යයනය කිරීම අධ්‍යයනයේ ගැටලුව වේ. ඒ සඳහා ද්විතීක දත්ත පදනම් කර ගෙන ඇත. ශ්‍රී ලංකා මහ බැංකු හා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තා, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරි වාර්තා, ආයතනික වාර්තා, පොත් පත් සහ සඟරා යනාදිය ඒවා වේ. සංචාරක ව්‍යාපාරය ගෝලීය වශයෙන් විශාලතම හා වේගයෙන් වර්ධනය වන කර්මාන්තයකි. එමෙන්ම කලාපීය සංවර්ධනයට මඟ පාදන, විවිධ වර්ගයේ රැකියා සහ ව්‍යාපාර සඳහා සෘජුවම සහාය වන සංචාරක කර්මාන්තය covid 19 හේතුවෙන් බිඳ වැටී ඇත. ගෝලීය තරඟකාරිත්වය තුළ සෞඛ්‍යාරක්ෂිත බව, ශ්‍රී ලාංකික අනන්‍යතාවය, ආගන්තුක සත්කාර වල අපගේ ශක්තිමත් මානව, සමාජීය හා පොහොසත් සාරධර්ම ප්‍රදර්ශනයෙන් නැවත ලෝකයට සන්නිවේදනයෙන් හා ස්ථානගත කිරීම සහ ශක්තිමත් ගමනාන්ත ප්‍රතිරූපයක් ගොඩනැගීමට ආරම්භ කර ඇත. එසේම සංචාරක කර්මාන්තය නැවත ගොඩනැංවීම සඳහා කෙටිකාලීන හා දිගුකාලීන සැලසුම් ක්‍රියාත්මක කර ඇත. මූල්‍යමය ප්‍රතිපාදන වෙන් කිරීම, නව සංචාරක ආකර්ෂණ ස්ථාන 12ක් සංවර්ධනය කිරීම, පැරණි දුම්රිය ස්ථාන නවීකරණය කිරීම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඇති මන්නාරම්, කල්පිටිය සහ මඩකලපුවෙහි පැරණි බලකොටු සංවර්ධනය කිරීම, රටවල් 48 ක් සඳහා වීසා බලපත්‍රය දීර්ඝ කිරීම, සංචාරක බද්ද අත්හිටුවීම සහ සංචාරක හෝටල් සහ වාහන හිමියන්ට සහන ලබා දීම ආදිය ඒ අතර විය.

**මූඛ්‍ය පදඃ** *ශ්‍රී ලංකාව, සංචාරක කර්මාන්තය, covid 19 වෛරසය, බලපෑම*

[1] ayeshaamadumali@gmail.com, ආර්ථිකවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික විශ්වවිද්‍යාල / විද්‍යායතන තෝරා ගැනීමට බලපාන සාධක

*බී. ජී. සි හෂානි [1]*

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ වර්තමානය වන විට උසස් අධ්‍යාපන අවස්ථා වර්ධනය වී තිබේ. ඒ අනුව වත්මන් තරුණ පරපුර උසස් අධ්‍යාපනය සඳහා වැඩි නැඹුරුතාවයක් දක්වමින් බොහෝ පිරිසක් ඒ සඳහා පෞද්ගලික විශ්වවිද්‍යාල/විද්‍යායතන තෝරා ගැනීමේ ප්‍රවණතාවයක් ඇති බව හඳුනාගත හැකිය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ සිසුන් උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික විශ්වවිද්‍යාල/විද්‍යායතන තෝරා ගැනීමට බලපාන සාධක හඳුනාගැනීමයි. හිම බෝල නියදිය යොදාගෙන දකුණු පළාතේ තරුණ ප්‍රජාව 50 දෙනෙක් නියදිය ලෙස ගනු ලැබීය. ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් දත්ත රැස්කර විස්තරාත්මක සංඛ්‍යානය භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කිරීමට SPSS හා Excel මෘදුකාංග භාවිත කර ඇත. දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵලවලට අනුව පෞද්ගලික විශ්වවිද්‍යාල/විද්‍යායතන තෝරාගැනීමට හේතු වන ප්‍රධාන සාධකය ලෙස අ.පො.ස උසස් පෙළ විභාගයේ පවතින අධික තරගකාරීත්වය සහ රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා තේරීමට Z අගය ප්‍රමාණවත් නොවීම බව අනාවරණය විය. එමෙන් ම රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා තේරීපත් වූ අය ද ප්‍රතිඵල පැමිණ වසරක් යනතුරු බඳවා ගැනීම් සිදු නොකිරීම,නවක වදය,කැමති විශ්වවිද්‍යාලය නොලැබීම,කැමති පාඨමාලාවට නොතේරීම,උපාධිය අවසන් කිරීමට දීර්ඝ කාලයක් ගතවීම,වසරක තුනක කාලයකින් විශේෂ උපාධියක් ලබා ගැනීමට හැකි වීම යන සාධක මෙම තෝරා ගැනීමට හේතු වී ඇති බව අනාවරණය විය. එමෙන් ම අ.පො.ස උසස් පෙළ ප්‍රතිඵල පැමිණීමට පෙර අපේක්ෂිත ප්‍රතිඵල මත උපාධිය ආරම්භ කිරීමට අවස්ථාව සලසා තිබීම,ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මගින් පිරිනමන උපාධි පාඨමාලාවන් මෙරට දී හැදෑරීමට හැකිවීම, පූර්ණ කාලීන හා අර්ධ කාලීන වශයෙන් තමන්ට රුචි පරිදි උපාධිය හැදෑරීමට හැකිවීම,රැකියා වෙළඳපොළට උචිත ප්‍රමිතිගත උපාධි හා පෞද්ගලික ආයතන අතර පවතින පුළුල් සබඳතාවය නිසා රැකියාවලට වැඩි ඉඩ ප්‍රස්ථාවක් ලැබීම යන හේතු ද බලපා ඇති බව අනාවරණය විය. පෞද්ගලික විශ්වවිද්‍යාලයක් තෝරා ගැනීමේ දී එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත වීම පිළිබඳව ද අවධානය යොමු කරන බව අධ්‍යයනයෙන් තහවුරු විය. තවද පෞද්ගලික විශ්වවිද්‍යාල/විද්‍යායතන අනුගමනය කරනු ලබන මහජන සම්බන්ධතා ක්‍රමෝපායන් හා වඩාත් තෘප්තිමත් සේවයක් සැපයීම සිසුන් පෞද්ගලික විශ්වවිද්‍යාල/විද්‍යායතන තෝරා ගැනීමට අදාළ තීරණාත්මක කාර්යයභාරයක් ඉටු කරන බව අධ්‍යයනයෙන් තහවුරු විය.

**මුඛ්‍ය පද:** *ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය, පෞද්ගලික විශ්වවිද්‍යාල/විද්‍යායතන, මහජන සම්බන්ධතාව*

[1] chamudihashani@gmail.com, ජනසන්නිවේදන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ රැකියා වෙළඳපොළ සඳහා විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ යෝග්‍යතාවය

*අයි. එච්. ආර්. ටී. එම්. බණ්ඩාර* [1]

**සංක්ෂේපය**

අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් අතරින් 23,000 ක් පමණ පිරිසක් පමණක් වාර්ෂිකව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබා ගත්තද විශ්වවිද්‍යාල සිසුන්ට ලබාගත් දැනුම ප්‍රායෝගිකව යොදා ගනිමින් රැකියාවක නිරතවීමට අවස්ථාව නොලැබේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ දැනට උපාධිය අවසන් කර ඇති උපාධිධාරීන් තම උපාධියට සුදුසු පරිදි උගත් දෑ උපයෝගී කරගනිමින් ඵලදායී රැකියාවන්හි නිරත වනවාදැයි සොයාබැලීම, විශ්වවිද්‍යාලයන්වල ඒ ඒ විෂයයන්ට අදාලව දැනට පවත්නා විෂය නිර්දේශයන් රැකියා වෙළඳපොළ සඳහා කෙතෙක් දුරට සුදුසු වන්නේදැයි සොයා බැලීම සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය රැකියා වෙළඳපොළට සුදුසු ආකාරයට ඉහළ නැංවීමේලා ක්‍රියාත්මක කර ඇති හා යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳව සලකා බැලීම යන කරුණු වේ. මෙම පර්යේෂණයේ සංගහනය ලෙස 2019 වර්ෂයේදී උපාධිය අවසන් කළ උපාධිධාරීන් හැඳින්විය හැකි අතර කැලණිය විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබා 2019 වර්ෂයේදී තම උපාධිය අවසන් කළ උපාධිධාරීන් ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ නියැදිය සඳහා තෝරා ගන්නා ලදී. මෙම පර්යේෂණය සඳහා ප්‍රශ්නාවලියක් යොදාගෙන සිසුන්ගෙන් ලබාගත් ප්‍රාථමික දත්ත මෙන්ම සංඛ්‍යාලේඛන හා දත්ත අධීක්ෂණ ඒකකයෙන් ලබාගත් ද්වීතියික දත්ත ද යොදා ගන්නා ලදී. රැස්කරගන්නා ලද දත්ත SPSS මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස දැක්විය හැක්කේ රැකියා වෙළඳපොළ තුළ පවතින ඉල්ලුම තාක්ෂණයත් සමග යාවත්කාලීන වුවද විශ්වවිද්‍යාල විෂය නිර්දේශයන්හි පවතින කරුණු යාවත්කාලීන නොවීම හා තාක්ෂණික වශයෙන් ප්‍රායෝගික දැනුමක් උපාධිධාරීන්ට නොමැති වීම විශාල ගැටළුවක් වන බවයි. එමෙන්ම රජය විසින් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ වෙනසක් ඇති කිරීම උදෙසා විෂය නිර්දේශයන් ආර්ථිකය මුල් කරගත් ක්‍රමවේදයකට සැකසීම, භාෂා හා තොරතුරු තාක්ෂණ අධ්‍යාපනයට ප්‍රමුඛත්වය ලබාදීම හා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැකසීම වැනි ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කර ඇත. මෙම පර්යේෂණයෙන් ලබාගත හැකි නිගමනය වනුයේ රැකියා වෙළඳපොළට ගැලපෙන ආකාරයෙන් උපාධිධාරීන් බිහිකිරීමේ අවශ්‍යතාවක් ඇති බවත් කඩිනමින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බවත්ය.

**මුඛ්‍ය පද:** රැකියා වෙළඳපොළ, විශ්වවිද්‍යාල, විෂය නිර්දේශය, උපාධිධාරීන්, අධ්‍යාපනය

[1] thilakmb96@gmail.com, සමාජ සංඛ්‍යානය අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ගුණාත්මක අධ්‍යාපනය සහ තිරසර සංවර්ධනය

*ඩී. පී. ඒ. එම්. වික්‍රමනායක* [1]

**සංක්ෂේපය**

ගෝලීය වශයෙන් 2030 වර්ෂය වන විට ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු 17 අතුරින් සිව්වන අරමුණ බවට පත්ව ඇත්තේ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමයි. එහි පරමාර්ථය වී ඇත්තේ "සියල්ලන් ඇතුළත් කර ගත් හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනය සහ සියල්ලන් උදෙසා ජීවිත කාලීන ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම" යන්නයි (www.undp.org). ලෝක බැංකුව පෙන්වා දෙන ආකාරයට ශ්‍රී ලංකාවේ ළමයෙකු සාමාන්‍යයෙන් වසර 13ක පාසල් අධ්‍යාපනයක් සම්පූර්ණ කරන නමුත් එහි ගුණාත්මකභාවය සමඟ සැසඳූ විට ළමයෙකුට හිමිව ඇත්තේ වසර 8.3කට සමාන ඉගෙනුමක් පමණි. ඒ අනුව වසර 4.7 ක ඉගෙනුම් පරතරයක් නිර්මාණය වී තිබේ (ලෝක බැංකුව, 2018). ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන ප්‍රවේශය පුළුල් කිරීම අරමුණු කර ගත් එකක් වන අතර පසුගිය දශක කීපයේ දී 92.7% ක ප්‍රශංසනීය සාක්ෂරතාවයක් සාක්ෂාත් කර ගෙන ඇත ( මහ බැංකු වාර්ෂික වාර්තාව, 2019). නමුත් නාගරික හා ග්‍රාමීය වශයෙන් අධ්‍යාපනයේ පවත්නා අසමානතා සැලකීමේ දී උදාහරණ වශයෙන් පාසල් වර්ගය අතර පවත්නා වෙනස්කම් සහ ඒවායේ යෝග්‍යතාවය අනුව දරුවන්ගේ ඉගෙනුම් සහ අධ්‍යාපනයේ ඵල සීමා වී තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ගුණාත්මක අධ්‍යාපන ප්‍රවේශය වෙත පවත්නා අසමාන අවස්ථා මොනවාද යන්න හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ගැටලුව වන අතර එමඟින් ඇති වන ප්‍රතිවිපාක පිළිබඳ විමසීම ද මෙහි අරමුණ විය. මේ සඳහා ද්විතීයික දත්ත යොදා ගෙන ඇති අතර ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු වාර්තා, අධ්‍යාපන දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තා, වෙනත් ආයතනික වාර්තා, පොත් පත් හා සඟරා ආදිය භාවිත කර ඇත. ඒ අනුව පාසල් වර්ගය, ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය හා සම්පත් යෙදවුම් හා පාසල් කළමනාකරණය තුළ අසමානතා තිබෙන බවත්, ඒවා ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා බලපාන බවත් හඳුනා ගැනීමට හැකි විය. මෙම අසමාන ඉගෙනුම් අවස්ථා දරුවන්ගේ ඉගෙනුම් ඵලයන්හි අසමානකම් වලට තුඩු දෙන අතර එය ජාතික විභාග වල කාර්ය සාධන වාර්තා සහ අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථාන වාර්තා මගින් විද්‍යාමාන වේ. ඒ අනුව, ශ්‍රී ලංකාව ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා සියල්ලන්ම ඇතුළත් වීම සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන නමුත් අධ්‍යාපනයේ ගුණාත්මක බව සම්බන්ධයෙන් අසමානතා පවතින බව මනාව පැහැදිලි වේ.

**මුඛ්‍ය පද** : *ගුණාත්මක අධ්‍යාපනය, අධ්‍යාපන අසමානතා, තිරසර සංවර්ධනය, ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය*

[1] ayeshaamadumali@gmail.com, ආර්ථිකවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන්ගෙන් අධ්‍යාපනයට COVID 19 වසංගතයේ බලපෑම

*එන්. එම්. එස්. එච්. එස්. මධුෂානි [1], බී. ජී. ටී. එච්. අමරකෝන් [2], ඩී. බී. එම්. සෙව්වන්දි [3]*

**සංක්ෂේපය**

කොරෝනා වෛරසය යනු සෙම්ප්‍රතිශ්‍යාවේ සිට දරුණු නිදන්ගත ශ්වසන රෝග දක්වා වර්ධනය විය හැකි රෝගාබාධ ඇති කරන විශාල වෛරසයකි. මෙය චීනයෙන් ආරම්භ වී ශ්‍රී ලංකාව ඇතුලු රටවල් 250කට අධිකව ව්‍යාප්ත විය. මේ හේතුවෙන් ලංකාවේ සියලුම අංශ කෙරෙහී විශාල බලපෑමක් එල්ල විය. එමගින් අධ්‍යාපනය කෙරෙහිද විශාල බලපෑමක් සිදු විය. ඒ අනුව එම වෛරසය හේතුවෙන් සියලුම විශ්වවිද්‍යාල මාස 5ක් පමණ අඛණ්ඩව වසා දැමුණි. මෙලෙස විශ්වවිද්‍යාල වසා දැමීම හේතුවෙන් කැලණිය විශ්වවිද්‍යාල සිසුන් අධ්‍යාපනික, තාක්ෂණික හා ආර්ථික වශයෙන් මුහුණ දුන් ගැටලු පිලිබඳ අධ්‍යනය කිරීම මෙම අධ්‍යනයේ මූලික අරමුණ විය. කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨ හතරක් තෝරා ගෙන එයින් එක් එක් වසර වලින් විද්‍යාර්ථීන් 100 බැගින් ගෙන 400ක නියැදියක් පොකුරු සසම්භාවී නියැදුම් ක්‍රමය මගින් තෝරාගන්නා ලදි. අධ්‍යනය සඳහා ප්‍රාථමික දත්ත යොදාගත් අතර එහිදී ප්‍රශ්ණමාලා ක්‍රමය මගින් දත්ත ලබාගන්නා ලදී. වගු හා ප්‍රස්තාර වැනි සරල සංඛ්‍යාන ක්‍රම මෙන්ම කයිවර්ග පරීක්ෂාව වැනි පරීක්ෂණ ක්‍රම මඟින් දත්ත විශ්ලේෂණය කරන ලදී. කොරෝනා සමයේ ඇඳිරි නීතිය දැමීම හේතුවෙන් ඔවුන්ට අධ්‍යාපන අවස්ථා බොහෝදුරට සීමා විය. මාර්ගගත අධ්‍යාපන ක්‍රමය හරහා අධ්‍යාපන කටයුතු සිදු කිරීමේදී පොළොන්නරුව, අනුරාධපුර වැනි දුෂ්කර ප්‍රදේශවල සිසුන්ට තාක්ෂණික මෙන්ම ආර්ථික ගැටලු නිසා දේශණ වලට සහභාගී විමට නොහැකි විය. පළමු වසර හා දෙවන වසර සිසුන්ට එම අවස්ථාවද අහිමි වූ අතර මෙහිදී වැඩි වශයෙන් බලපෑම් එල්ල වූයේ ඔවුන්ටය. ඒ අනුව COVID 19 වසංගතය කැලණිය විශ්වවිද්‍යාල සිසුන්ගේ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපා ඇති බව දත්තවලට අනූව නිගමනය කළ හැකිය. විභාග කටයුතු සිසුන්ට පීඩනයක් නොවන ආකාරයට පැවැත්වීම, සිසුන්ගේ සෞඛ්‍ය ආරක්ෂිත පිළිවෙත් නිවැරදිව අනුගමනය කිරීම, ඇගයීම් ලකුණු සාමාන්‍යයෙන් ලබාදෙන ප්‍රමාණයට වඩා වැඩි කිරීමට කටයුතු කිරීම කොරෝනා වෛරසය නිසා සිසුන්ට බලපෑ අධ්‍යාපන ගැටලු වලට විසඳුමක් ලෙස යෝජනා කළ හැකිය.

**මුඛ්‍ය පදඃ** කොරෝනා වෛරසය, අධ්‍යාපනය, විශ්වවිද්‍යාල සිසුන්

[1] sachinimadhushni1997@gmail.com, සමාජ සංඛ්‍යානය අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

[2] harshanithilona@gmail.com, සමාජ සංඛ්‍යානය අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

[3] madukasewwandi890@gmail.com, සමාජ සංඛ්‍යානය අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# ව්‍යවසායකත්වය සඳහා කැලණිය විශ්වවිද්‍යාල සිසුන්ගේ නැඹුරුව

*ඩබ්. ඒ. වි. ඩී. කේ. අතුකෝරල* [1]

**සංක්ෂේපය**

නව ව්‍යාපාර ඇරඹීම නැතහොත් පවතින ව්‍යාපාරයකට නව මුහුණුවරක් ගෙන ඒම යන අර්ථ දැක්වීම අපට ව්‍යවසායකත්වයට ලබාදිය හැකිය. රටක ආර්ථිකයට විශාල බලපෑමක් සිදු කළ හැකි බල ප්‍රභවයක් ලෙස ව්‍යවසායකත්වය අපට හඳුනාගත හැක. නමුත් වර්තමනයේ පවත්නා ව්‍යාපාරවලින් බොහෝමයක හිමිකාරීත්වය දරන්නන් වන්නේ ව්‍යාපර පිළිබඳ වැඩි දුර අධ්‍යාපනයක් නොලැබූ සාමන්‍ය පුද්ගලයන් ය. ඒ අනුව උසස් අධ්‍යාපනයක් ලැබූ විශ්වවිද්‍යාල සිසුන්ද නව ව්‍යාපාර ආරම්භ කිරීමට නැඹුරුවක් දක්වයි ද? නොදක්වයි ද? යන්න විමසීම සහ එයට බලපාන සාධක ගවේෂණය  මෙන්ම සිසුන් තුළ ඇති ව්‍යාපාරික දැනුම වර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම මෙම පරීක්ෂණයේ මූලික අරමුණ වේ. ඒ අනුව, කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨ හතරක් තෝරා ගෙන එයින් එක් එක් වසර වලින් විද්‍යාර්ථීන් 100 බැගින් ගෙන 400ක නියැදියක් කොටස් නියැදුම් ක්‍රමය මඟින් තෝරාගන්නා ලදි. අධ්‍යයනය සදහා ප්‍රාථමික දත්ත යොදාගත් අතර එහිදී ප්‍රශ්නමාලා ක්‍රමය මඟින් දත්ත ලබා ගන්න ලදී. වගු, ප්‍රස්තාර හා කයිවර්ග පරීක්ෂාව වැනි පරීක්ෂණ ක්‍රම මඟින් දත්ත විශ්ලේෂණය කරන ලදී. නව ව්‍යාපාර ආරම්භ කිරීමේදී අවධානමක් ගැනීමට සිදු වන අතර එම අවධානමට මුහුණදීමට සිසුන් බිය වීමද, නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔවුන්ට මූලික ප්‍රාග්ධනයක් නොමැති වීම, ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ව්‍යාපාර පිළිබද දැනුමක් නොමැති වීම, මෙලෙස ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය සම්පත් රජයෙන් ප්‍රමාණවත්ව නොලැබීම යන ගැටලු හදුනාගත හැකිවිය. එසේම වර්තමාන ලෝකයක් මුහුණ දී ඇති කොරෝනා වසංගතය නිසා අද නව නිර්මාණ හා නව ව්‍යාපාර පිළිබද බොහෝ සිසුන්ගේ අවධානය යොමු වී ඇති අතර ඒ සදහා රජයේ අදාළ බලධාරීන් ඊට දිරිගැන්වීම් සිදු කිරීම, විශ්වවිද්‍යාල සිසුන්ගේ ව්‍යාපාරික දැනුම වර්ධනයට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නව ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය රජය විසින් පහසු ක්‍රම යටතේ සැලසීම නව ව්‍යාපාර ඇරඹීමට සිසුන්ගේ නැඹුරුව වැඩි කිරීමට උපක්‍රම ලෙස යෝජනා කළ හැකිය.

**මුඛ්‍ය පදඃ** විශ්වවිද්‍යාල සිසුන්, නව ව්‍යාපාර ඇරඹීම

[1] vvimukthiathukorala@gmail.com, අලෙවි කළමනාකරණ අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය